# එක්සත් ජාතීන් ගැන ඔබට දැන ගැනීමට අවශ්‍යව තිබූ සියලු දේ



# එක්සත් ජාතීන් ගැන ඔබට දැන ගැනීමට අවශ්‍යව තිබූ සියලු දේ...

## (ද්වීතියික මට්ටමේ සිසුන් සඳහා)

එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කොළඹ, එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය විසින්
පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කැරිණ.

**1**

# එක්සත් ජාතීන් හැඳින්වීම

## 1. එක්සත් ජාතීන් යනු කුමක් ද?

එක්සත් ජාතීන් ලෝක සාමය සහ ආර්ථික හා සාමාජයීය ප්‍රගමනය උදෙසා ක්‍රියා කිරීම පිණිස ස්වේච්ඡාවෙන් ඒකරාශි වී සිටින ස්වාධීන රාජ්‍යයන්ගේ අද්විතීය සංවිධානයකි. සාමාජික රාජ්‍යයන් 51 ක සහභාගිත්වයෙන් 1945 ඔක්තෝබර් 24 වැනිද එය නිල වශයෙන් උපත ලැබී ය. අද එහි සාමාජික සංඛ්‍යාව 185 කි. කිසිදු කිසිදු රටක් එක්සත් ජාතීන් හැර ගොස් නැත. අසල් වැසි මැලේසියාව සමග ආරවුලක් නිසා ඉන්දුනීසියාව 1965 දී එක්සත් ජාතීන්ගෙන් තාවකාලිකව ඉවත් වුවද ඊට පසු වර්ෂයේ දී යළි එක් විය.

## 2. එසේ නම් එක්සත් ජාතීන් ලෝක ආණ්ඩුවක් බඳුය. හරි ද?

වැරදි ය. ආණ්ඩු, රටවල් හා ජනතාවන් නියෝජනය කරයි. එක්සත් ජාතීන් කිසියම් ආණ්ඩුවක් හෝ කුමන ජාතියක් හෝ නියෝජනය කරන්නේ නැත. එය ස්වෛරී රාජ්‍යයන්ගේ සංගමයක් වැනිය. ඊට කළ හැක්කේ සාමාජිකයනට අවශ්‍ය දේ පමණි. ස්වාධීන ජාතීන්, තමන්ට පෞද්ගලිකව හෝ සාමූහිකව හෝ බලපාන ලෝක ප්‍රශ්න සාකච්ඡා කිරීමට රැස්වෙන ජගත් සංවාද මණ්ඩපයකට එය වඩාත් ළං වෙයි.

## 3. එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරිත්වය හසුරුවන මූලධර්ම සහ රීති මාලාවක් තිබේ ද?

ඔව්. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය. එය එකිනෙක රටේ අයිතිවාසිකම් හා යුතුකම් සහ ඔවුන් විසින්ම නියම කොට ගත් පරමාර්ථ සාක්ෂාත් කර ගනු පිණිස කළ යුතු දේ පැහැදිලි කරන ගුරුපදේශ මාලාවකි. ජාතියක් එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලැබූ විට එය ප්‍රඥප්තියේ අරමුණු හා නීති පිළිගනී. ජාතීන් 50 ක නියෝජිතයෝ 1945 ජුනි 26 වැනිද සැන් ෆ්‍රැන්සිස්කෝහි දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් තැබූහ. යුද්ධයට පසු ස්වකීය ආණ්ඩු සැකැස්ම එතෙක් තීරණය නොකොට තිබූ හෙයින් නියෝජිතයකු එවීමට නොහැකි වූ පෝලන්තය පසුව අත්සන් තබා එක්සත් ජාතීන්ගේ ආරම්භක සාමාජිකයන්ගෙන් පනස් එක් වැන්නා බවට පත්විය.

ප්‍රඥප්තියේ මුල් පිටපත සුරැකිව තබන මෙන් සත්කාරක රාජ්‍යය වූ එක්සත් ජනපදයෙන් ඉල්ලා සිටිනු ලැබුයෙන් එය වොෂින්ටනයේ ජාතික ලේඛනාගාරයේ තැන්පත් කෙරිණ. ප්‍රඥප්තියේ එක සමාන පිටපතක් නිව්යෝක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ ප්‍රදර්ශනයට තබා ඇත.

දෙවන ලෝක යුදධයේදී ජපානයේ හිරෝෂිමා නගරයට පරමාණු බෝම්බය හෙළීම නිසා සිදුවූ විනාශය.



## 4. එක්සත් ජාතීන්ගේ අරමුණු සහ පරමාර්ථ කවරේ ද?

### එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරමාර්ථ සතරකි ?

(i) ලොව පුරා සාමය පවත්වා ගැනීම.

(ii) ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය.

(iii) දිළිඳු ජනයාගේ ජීවන තත්වය නගා සිටුවීම, සාගින්න, ලෙඩරෝග සහ නූගත්කම පිටු දැකීම හා එකිනෙකාගේ අයිතිවාසිකම්වලට හා නන්වැදෑරුම් නිදහසට ගරු කිරීමට පෙළඹවීම පිණිස එක්ව වැඩ කිරීම.

(iv) මෙකී පරමාර්ථ අත්කැර ගැනීම සඳහා ජාතීනට උපකාරී වන සංවාද මණ්ඩපයක් සේ ක්‍රියා කිරීම.

## 5. එක්සත් ජාතීන් ආරම්භ වූයේ කෙසේ ද?

එක්සත් ජාතීන් පිළිබඳ අදහස උපත ලැබුයේ වේදනාකාරී දෙවැනි ලෝක යුද්ධ සමයේදී ය. (1939-1945) දස ලක්ෂ සංඛ්‍යාත ජනකායක් මිය ගියහ. තවත් දස ලක්ෂ සංඛ්‍යාත මිනිසුනට උන් හිටි තැන් අහිමි විය. නගර නටබුන්ව තිබිණ. යුද්ධය නතර කිරීමට අත්වැල් බැඳගත් ලෝක නායකයෝ සාමය උදා කිරීමටත් අනාගත යුද්ධ වැළැක්වීමටත් යන්ත්‍රණයක් අවශ්‍ය බව දැඩිව වටහා ගත්හ. මෙය කළ හැක්කේ සියලු ජාතීන් ජගත් සංවිධානයක් මගින් එක්ව ක්‍රියා කරන්නේ නම් පමණකැයි ඔවුනට අවබෝධ විය. එක්සත් ජාතීන් ලෙස උපත ලැබුයේ ඒ සංවිධානය යි.

එක්සත් ජාතීන් එක් රැයකින් ගොඩ නැගුණා නොවෙයි. සංවිධානය සැබවින්ම උපත ලැබුයේ වසර ගණනාවක සැළසුම් සම්පාදනයෙනි. එය සිදුවූයේ මෙසේය :

- 1941 අගෝස්තු 14 වැනිදා එක්සත් ජනපද ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් ඩී. රූස්වෙල්ට් සහ එක්සත් රාජධානියේ අගමැති වින්ස්ටන් චර්චිල් අත්ලාන්තික් සාගරයේ යුධ නෞකාවෙක දී රහසිගතව හමු වීමෙන් පසු ලෝක සාමය සඳහා වන සැලැස්මක් නිවේදනය කළහ. ඔවුන් මේ සැලැස්ම හැඳින්වූයේ **අත්ලාන්තික් ප්‍රඥප්තිය** නමිනි.

- 1942 ජනවාරි 1 වැනිදා රටවල් 26 ක නියෝජිතයෝ වොෂින්ටන් ඩී.සී. හි රැස්ව **එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයට** අත්සන් කළහ. යුද්ධය ජයග්‍රහණය කිරීමටත් අත්ලාන්තික් ප්‍රඥප්තිය පිළිගැනීමටත් ඔවුහු ප්‍රතිඥා දුන්හ.

- 1943 ඔක්තෝබර් මාසයේ මොස්කව් නුවර දී හමු වූ චීනය, සෝවියට් දේශය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන රටවල නියෝජිතයෝ යුද්ධය අවසන් වීමෙන් පසු සාමය පවත්වා ගැනීම සඳහා ජාතීන්ගේ සංවිධානයක් පිහිටුවීමට එකග වූහ. මේ සම්මුතිය **මොස්කව් ප්‍රකාශනය** ලෙස පතළ විය.

- 1944 ගිම්හානයේ සහ සරත් සෘතුවේ වොෂින්ටන් ඩී.සී. හි පැවැති සමුළුවක දී අන්තර්ජාතික සංවිධානයක් පිහිටුවීම සඳහා වූ නිශ්චිත සැලසුම් සම්පාදනය කෙරිණ. මේ රැස්වීම බොහෝ විට ඩම්බාටන් ඕක්ස් සමුළුව යනුවෙන් හැඳින්වෙන්නේ ඒ නමින් යුත් වතු යායක දී එය පැවැති බැවිනි.

- 1945 පෙබරවාරි මාසයේ, ජනාධිපති රූස්වෙල්ට් අගමැති චර්චිල් සහ සෝවියට් දේශයේ නායක ජෝසප් ස්ටාලින් සෝවියට් දේශයේ යෝල්ටාවේ දී හමු වූහ. ආරක්ෂක මණ්ඩලය තුළ ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය ගැන ඔවුන් එකඟ වූයේ එහිදී ය. ජාතීන්ගේ සමුළුවක් සැන් ෆ්‍රැන්සිස්කෝ හි දී පැවැත්වීමට ද ඔවුහු තීරණය කළහ.

- රටවල් 50 ක නියෝජිතයෝ සැන් ෆ්‍රැන්සිස්කො සමුළුවට (1945- අප්‍රේල් 25 - ජුනි 26) සහභාගිවූහ. **එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය** සහ නව අන්තර්ජාතික අධිකරණයට අදාළ නීති සම්පාදනය කළ ඔවුහු ජුනි 26 ද ඒවා සම්මත කොට ගත්හ.

- 1945 ඔක්තෝබර් 24 වැනිදා, ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සාමාජිකයන් පස් දෙනා ද ඇතුළුව, ආරම්භක සාමාජිකයන්ගේ බහුතරය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් තබා එය නිල වශයෙන් පිළිගැනීමෙන් අනතුරුව එක්සත් ජාතීන් විධිමත් ලෙස උපත ලැබී ය. ඔක්තෝබර් 24 - එක්සත් ජාතීන් ගේ උපන් දිනය - **එක්සත් ජාතීන්ගේ දිනය** ලෙස ලොව පුරාම සමරනු ලබන්නේ එහෙයිනි.

## 6. එක්සත් ජාතීන් යන නාමය ආවේ කොයිබින් ද?

එක්සත් ජාතීන් යන නාමය යෝජනා කරන ලද්දේ ජනාධිපති ෆ්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට් විසිනි. රටවල් 26 ක නියෝජිතයන් 1942 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය අත්සන් තැබූ අවස්ථාවේ එය ප්‍රථමවරට නිල වශයෙන් භාවිත කරනු ලැබී ය. ප්‍රඥප්තිය අත්සන් තැබීමට සති කිහිපයකට පෙර අභාවප්‍රාප්තවූ ජනාධිපති රූස්වෙල්ට් හට උපහාරයක් පිණිස ඔහු යෝජනා කළ නම පිළිගැනීමට සැන් ෆ්‍රැන්සිස්කෝ සමුළුවට සහභාගි වූ සියලු දෙනාම එකඟ වූහ.

## 7. මෙබඳු සංවිධානයක් නිර්මාණය කැරුණු ප්‍රථම අවස්ථාව මෙය ද ?

නැත. ප්‍රථම ලෝක සංග්‍රාමයෙන් අනතුරුව 1919 දී **ජාතීන්ගේ සංගමය** පිහිටුවනු ලැබී ය. එක්සත් ජාතීන්ගේ මෙන්ම එහිද ප්‍රධාන පරමාර්ථය වූයේ ලෝක සාමය පවත්වා ගැනීම යි.

අවාසනාවට, සෑම රටක්ම සංගමයට එක් වූයේ නැත. නිදසුනක් ලෙස එක්සත් ජනපදය කිසි දිනෙක සාමාජිකයෙක් නොවී ය. ඊට එක්

වූ අය පවා පසුව ඉවත්ව ගියහ. නැතහොත් කිසිදු තීරණයක් ගැනීමට අපොහොසත් වූහ. සිය තීරණ ක්‍රියාත්මක කිරීමේ අධිකාරී බලයක් ද සංගමයට නොතිබිණ. සංගමයේ බිඳ වැටීම දෙවැනි ලෝක යුද්ධයට තුඩු දුන් ගැටුම්කාරී ගමන වේගවත් කළේ ය. සංගමය අසාර්ථක වුව ද එය විශ්ව සංවිධානයක් පිළිබඳ සිහිනය පණ ගැන්වී ය. ප්‍රතිඵලය වූයේ එක්සත් ජාතීන් ය.

## 8. එක්සත් ජාතීන්ගේ මූලස්ථානය කොතැනක ද?

එක්සත් ජාතීන්ගේ මූලස්ථානය නිව්යෝක් නගරයේ පිහිටුවා තිබේ. සංවිධානයේ ස්ථිර මූලස්ථානය එක්සත් ජනපදයේ විය යුතු යයි ලන්ඩනයේ පැවැති ප්‍රථම මහා මණ්ඩල රැස්වීමේ දී තීරණය කෙරිණ. එක්සත් ජාතීන්ගේ මූලස්ථානය ගොඩනැගිලි හතරකින් සමන්විත ය. පහත් ශිඛර ගෝලය සහිත මහා මණ්ඩල ශාලාව, 39 මහල් වීදුරු හා කිරිගරුඬ ලේකම් කාර්යාල කුළුණ, ඍජුකෝණාස්‍රාකාර සම්මන්ත්‍රණ ශාලාව, සහ නිරිත දිග කොටසේ පිහිටි ඩැග් හැමර්ෂෙල්ඩ් පුස්තකාලය වශයෙනි.

එක්සත් ජාතීන්ගේ මූලස්ථාන ගොඩනැගිල්ල සහ ඉඩම අන්තර්ජාතික කලාපයකි. එක්සත් ජාතීන්ට තමන්ගේ ම ධජයක් ඇති බව, ප්‍රදේශයේ පොලිස් බලතල භාර තමන්ගේ ම ආරක්ෂක නිලධාරීන් සිටින බව සහ තමන්ගේ තැපැල් මුද්දර නිකුත් කරන බව ඉන් අදහස් වෙයි.

## 9. එක්සත් ජාතීන්ගේ ව්‍යුහය සකස් වී ඇත්තේ කෙලෙසක ද?

එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරකම් ලොව පුරාම පාහේ පැතිර තිබෙන අතර ඒවා සිදු කෙරෙනුයේ ප්‍රධාන ආයතන (අවයව) හයක් මගිනි. ඒ නම්,

(i) **මහා මණ්ඩලය (මන්ත්‍රණ සභාව)**
(ii) **ආරක්ෂක මණ්ඩලය**
(iii) **ආර්ථික හා සමාජයීය මණ්ඩලය**
(iv) **භාරකාර මණ්ඩලය**
(v) **අන්තර්ජාතික අධිකරණය**
(vi) **ලේකම් කාර්යාලය**

නෙදර්ලන්තය හේග් නුවර පිහිටි අන්තර්ජාතික අධිකරණය හැර මේ ආයතන සියල්ල නිව්යෝක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානය නිවහන කොට ගෙන ඇත.

**ට්‍රිග්වේ ලී (නෝර්වේ)**
**1946-1952**



**ඩැග් හැමර්ෂල්ඩ් (ස්වීඩනය)**
**1953-1961**



**ඌ තාන්ට් (බුරුමය වර්තමානයේ මියන්මාර්)**
**1961-1971**



විශේෂිත ආයතන නමින් හැඳින්වෙන තවත් සංවිධාන 14 ක් එක්සත් ජාතීන් හා සම්බන්ධව පවතී. සෞඛ්‍යය, කෘෂි කර්මය, තැපැල් රෙගුලාසි සහ කාලගුණය වැනි විවිධ වූ ක්ෂේත්‍රවල ඒවා ක්‍රියාත්මකවේ. සුවිශේෂ ක්ෂේත්‍රවල. වගකීම භාර වෙනත් **වැඩසටහන්, අරමුදල් සහ විශේෂ මණ්ඩල** 35 ක් ඇත. එක්සත් ජාතීන් සහ මෙකී මණ්ඩල හා විශේෂිත ආයතන, වැඩ සටහන් එක් වූ විට එක්සත් ජාතීන්ගේ පද්ධතිය නිර්මාණය වෙයි.

### 10. එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා පත් වන්නේ කෙසේ ද? ඔහුගේ කාර්යභාරය කුමක් ද?

ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත, මහා මණ්ඩලය විසින් පස් අවුරුදු කාල සීමාවක් සඳහා **මහ ලේකම්වරයා** පත් කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ ආරම්භයේ සිට මේ දක්වා මහ ලේකම්වරුන් ගණන හතකි.

- **ට්‍රිග්වේ ලී (නෝර්වේ) 1946-1952**
- **ඩැග් හැමර්ෂල්ඩ් (ස්වීඩනය) 1953-1961**
- **ඌ තාන්ට් (බුරුමය වර්තමානයේ මියන්මාර්) 1961-1971**
- **කර්ට් වොල්ඩ්හයිම් (ඔස්ට්‍රියාව) 1972-1981**
- **හාවියර් පෙරේස් ඩි ක්වෙල්යා (පිරූ 1982-1991)**
- **බුත්‍රොස් බුත්‍රොස් ඝාලි (ඊජිප්තුව) 1992-1996**
- **කොෆී අන්නන් (ඝානාව) 1997- ....**

ලිඛිත නීතියක් නැත ද දැන් මහ ලේකම් පදවිය වරින් වර විවිධ කලාපීය කණ්ඩායම් අතර මාරු කරනු ලැබේ. ගත වූ විසිපස් වසර මුළුල්ලේ එය සිදු වී ඇත. නිදසුනක් ලෙස බුරුමයේ ඌ තාන්ට්ගෙන් (ආසියාව) පසු මහ ලේකම් ධුරයට පත් වුයේ බටහිර යුරෝපීයයෙකි (කර්ට් වොල්ඩ්හයිම් - ඔස්ට්‍රියාව), ඔහුගෙන් අනතුරුව පිරූ රාජ්‍යයේ (ලතින් අමෙරිකාව) හාවියර් පෙරෙස් ඩි ක්වෙල්යා පත්විය. තිදෙනොම පස් අවුරුදු කාල දෙක බැගින් සේවය කළහ. ඊජිප්තුවේ බුත්‍රොස් බුත්‍රොස් ඝාලි (අප්‍රිකාව) සංවිධානයේ සය වැනි මහ ලේකම් වරයා ලෙස තෝරා ගනු ලැබීය.

**කර්ට් වොල්ඩ්හයිම්**
**(ඔස්ට්‍රියාව)**
**1972-1981**



ඔහු එක් වාරයක් පමණක් සේවය කළ අතර ඉක්බිති ඝානාවේ (තවත් අප්‍රිකානු රටක්) කොෆී අන්නන් 1997 දී තෝරා ගන්නා ලදි.

ලෝක සාමයට තර්ජනයක් විය හැකියයි තමන් අදහස් කරන ඕනෑම ගැටළුවක් ආරක්‍ෂක මණ්ඩලයේ අවධානයට යොමු කිරීමට මහ ලේකම් වරයාට පිළිවන. මහා මණ්ඩලය විසින් හෝ එක්සත් ජාතීන්ගේ අන් කවර ආයතනයක් විසින් හෝ සාකච්ඡාවට ගතයුතු කරුණු යෝජනා කිරීමට ඔහුට බලය ඇත. සාමාජික රටවල් අතර ආරාවුල්වල දී මහ ලේකම් වරයා බොහෝ විට "විනිශ්චයකරුවකුසේ" ක්‍රියා කරයි. ඇතැම් විට ඔහුගේ මැදිහත්වීමේ හෝ "සුහද මෙහෙවරක" හෝ ප්‍රතිඵල විසින්, ගැටළු, ආරක්‍ෂක මණ්ඩලය හෝ මහා මණ්ඩලය වෙත කිසි විටකත් යොමු කරන්නේ නැතිවම, නැතහොත් විවෘත ගැටුමක් බවට පත්වීමට පෙර සමතයකට පත් කර ගැනෙයි.

**හාවියර් පෙරේස් ඩි ක්වෙල්යා (පිරූ 1982-1991)**



## 11. එක්සත් ජාතීන්ගේ කාර්යයන් සඳහා මුදල් ගෙවන්නේ කවු ද? කෙතරම් ද?

එක්සත් ජාතීන් කරන සෑම දෙයක් සඳහාම මුදල් ගෙවන්නේ ගණනින් 185 ක් වන එක්සත් ජාතීන්ගේ සාමාජිකයන්ය. ඒ හැර වෙනත් ආදායම් මාර්ගයක් ඊට නැත.

එක්සත් ජාතීන්ගේ අයවැය දෙයාකාරයි. **නිත්‍ය අයවැය** නිව්යෝක් හි ලේකම් කාර්යාලයේ සහ ලොව පුරා ක්‍ෂෙත්‍ර කාර්යාලවල කාර්යයන් ඇතුලත් කර ගනී. ගැටුම් පවතින ප්‍රදේශ ඇතුළු ලෝකය පුරා විවිධ මෙහෙයුම් සඳහා මුදල් ගෙවන්නේ **සාම සාධක අයවැයෙනි.** සාමාජික රටවල් මේ අයවැය දෙකටම අනිවාර්යයෙන් දයක විය යුතුය. සියලු දෙනා ගිවිස ගත් තක්සේරු පරිමාණයක් අනුව සාමාජිකයෝ මුදල්

**බූත්‍රොස් බූත්‍රොස් ඝාලි**
**(ඊජිප්තුව)**
**1992-1996**



**කොෆී අන්නන්**
**(ඝානාව) 1997- ....**



ගෙවති. රටක ගෙවීමේ හැකියාව, ජාතික ආදායම සහ ජනගහනය මත මේ පරිමාණය පදනම් වී ඇත.

1997 දී එක්සත් ජාතීන්ගේ නිත්‍ය අයවැය වසරකට ඩොලර් බිලියන 1.3 ක් විය. මේ මුදල් ප්‍රමාණය නිව්යෝක් නගරයේ වාර්ෂික අයවැයෙන් සියයට 4ක් පමණි. 1996 සාම සාධක අයවැය ඩොලර් බිලියන 1.6 ක් විය. යුධ වැදීමට සහ ඉන් විනාශ වන දේ නැවත සෑදීමට වැයවන මුදල සලකන කල සාම සාධක මෙහෙයුම් සඳහා වැය කරන මුදල අර්ථවත් වියදමකි.

**තතු විමසුම : "මහ හත් දෙනා"**

*එක්සත් ජාතීනට අරමුදල් සැපයෙන්නේ සාමාජික රටවලිනි. 1996 දී එක්සත් ජාතීන්ගේ ප්‍රධාන දායකයන් හත් දෙනා :*

- *ඇමරිකාව (25%)*
- *ජපානය (15.6%)*
- *ජර්මනිය (9%)*
- *ප්‍රංශය (6.4%)*
- *බ්‍රිතාන්‍යය (5.3%) සහ*
- *රුසියානු ෆෙඩරේෂනය (4.3%)*

*ඔවුහු එක්ව එ.ජා. අයවැයෙන් 66% වඩා සම්පාදන කරති.*

එක්සත් ජාතීන්ගේ ආයතන පද්ධතිය සාමාජයීය හා ආර්ථික සංවර්ධනය උදෙසා - සාගින්නෙන් පීඩිතයනට ආහාර සැපයීම, මාරාන්තික රෝග වලින් බේරා ගැනීම සඳහා ළමයින් ප්‍රතිශක්තිකරණය, වැඩිපුර ආහාර නිෂ්පාදනය, වාරි කර්මාන්තය., සහ පරිසරය තවදුරටත් විනාශ වීමෙන් රැක ගැනීම සඳහා - අවුරුදු පතා ඩොලර් බිලියන 4.5 ක් පමණ වැය කරයි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) එක්සත් ජාතීන්ගේ



ජනගහන අරමුදල (UNFPA) බඳු ආයතන සාමාජික රටවල ස්වේච්ඡා ප්‍රදානයන් මගින් උපයා ගන්නා මුදල් මේ සඳහා වැය කැරේ. මේ මුදල ලෝකයේ සෑම මනුෂ්‍යයකුටම සත 80 බැගින් වෙයි. අනෙක් අතට ලෝකයේ ආණ්ඩු යුධ වියදම් ලෙස 1994 දී වැය කළ මුදල ඩොලර් බිලියන 778 කි. පුද්ගලයකුට ඩොලර් 134 බැගිනි.

## 12. එක්සත් ජාතීන් භාවිත කරන භාෂා මොනවා ද?

අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ එක්සත් ජාතීන්ගේ නිල භාෂාවෝ වෙති. ඉංග්‍රීසි සහ ප්‍රංශ වැඩ කරන භාෂා දෙකයි. නියෝජිතයකුට කවර හෝ නිල භාෂාවකින් කතා කිරීමට පිළිවන. කතාව එකවිට සෙසු නිල භාෂාවලට පරිවර්තනය කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ බොහෝ ලේඛන නිල භාෂා හයෙන්ම ප්‍රකාශයට එක් කැරේ. ඇතැම්විටෙක නියෝජිතයකු නිල නොවන භාෂාවකින් ප්‍රකාශයක් කිරීමට ඉඩ ඇත. එවිට අදාළ දූත පිරිස ප්‍රකාශනයේ පරිවර්තනයක් හෝ නිල භාෂාවකින් ලිඛිත පිටපතක් හෝ සැපයිය යුතුම ය.

එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ සිය වැඩ කරන භාෂා ලෙස ඉංග්‍රීසි හෝ ප්‍රංශ හෝ භාවිත කරති. වෙනත් වචන වලින් කියතහොත් ලේකම් කාර්යාලයේ සේවය කරන කවරකුට වුව ද ඉංග්‍රීසි සහ ප්‍රංශ භාෂා දෙකෙන් එකක (හෝ දෙක්හිම) ව්‍යක්ත දැනුමක් තිබිය යුතු ය.

**එක්සත් ජාතීන්ගේ නිව්යෝර්ක් නගරයේ මහලේකම් කාර්යාලය**



## තතු විමසුම :

## මස් මඩුවක තැනූ මන්දිරය

එක්සත් ජාතීන්ගේ මූලස්ථානය එක්සත් ජනපදයේ ඉදිකළ යුතු බව මුල්වරට 1946 දී ලන්ඩන්හි දී රැස් වූ මහා මණ්ඩලය තීරණය කළ නමුදු සුදුසු භූමියක් සෙවීමට පත් කැරුණු ප්‍රථම කමිටුවේ පළමු තේරීම වූයේ නිව්යෝක් නගරය නොවේ. පිලඩෙල්පියා, බොස්ටන් සහ සැන් ප්‍රැන්සිස්කෝ වැනි නගර කමිටුවේ සැලකිල්ලට යොමු විය. නිව්යෝක් නුවර තෝරා ගත්විට පවා කමිටුවේ අවධානයට යොමු වූයේ නගරයේ උතුරු දිග ස්ථාන සමහරකි, වත්මන් භූමි භාගය තෝරා ගැනීමට ඔවුන් පෙළැඹවූ සාධකය වූයේ පළමුවැනි පටුමගේ භූමි භාගය මිළට ගැනීම සඳහා ජෝන් ඩී. රොකෆෙලර්, කණිෂ්ඨ විසින් අවසාන මොහතේ පිරිනැමූ ඩොලර් මිලියන 8.5 ක මුදල් ත්‍යාගය යි. පසුව නිවේයෝක් නගරය තවත් දේපල තෑගි කළේ ය. එක්සත් ජාතීන්ගේ මූලස්ථානය සඳහා තෝරාගත් භූමි භාගය මස්මඩු, ලුහු කර්මාන්ත සහ දුම්රිය මාර්ග ගරාජයක් පිහිටි එකක් විය. එක් පසෙකින්, පළමුවැනි පටුමග ඔස්සේ ට්‍රක් රථ ඉහළ පහළ ගමන් කළ අතර පසුව, ෆ්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට් නමින් එෆ්. ඩී. ආර් මාවත යනුවෙන් නම් කැරුණු නැගෙනහිර ගංගා මාවත ඔස්සේ මෝටර් රථවාහන ධාවනය වූයේ ය. අහසට නැගුණු එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලත් සමඟ භූමි භාගයේ දර්ශනය මුළු මනින්ම වෙනස් වී ඇත.

ආරම්භයේදී සැලසුම්කරුවන්ට අවශ්‍ය වූයේ ඩොලර් මිලියන 85 ක වියදමින් මහල් 45 ක මන්දිරයක් තැනීමට වුව ද මහ ලේකම් ට්‍රිග්වේ ලී ගේ නියමය අනුව වියදම ඩොලර් මිලියන 20 කින් ද මහල් සංඛ්‍යාව 39 දක්වා ද අඩු කරනු ලැබී ය. එක්සත් ජනපද ආණ්ඩුව ඉදි කිරීම් සඳහා වියදම පියවා ගනු පිණිස ඩොලර් මිලියන 65 ක පොලී රහිත ණයක් ප්‍රදානය කෙළේ ය. ණය මුදල ආපසු ගෙවීමේ අවසන් වාරිකය 1982 දී ගෙවන ලදි.

1949 ඔක්තෝබර් 24 වැනි ද මහ ලේකම් ට්‍රිග්වේ ලී මූලස්ථාන ගොඩනැගිල්ලට මුල්ගල තැබී ය. මාස දහ නවයකට පසු, 1951 අගෝස්තු 21 ද, ලේකම් කාර්යාල සේවක මණ්ඩලය නව කාර්යාල වෙත පිවිසීමට පටන් ගත්හ.

### *එක්සත් ජාතීන් නොවේ නම්....... අන් කවරෙක් ද?*

*ලෝකයේ සාමය හා ප්‍රගතිය කරා යන ගමනේ දී එක්සත් ජාතීන් අතිශය තීරණාත්මකය. එය රෝග වලට එරෙහිව ළමයින් එන්නත් කරයි, ආරක්ෂා සහිතව විසීමට සහ ආපසු නිවෙස් වෙත යාමට සරණාගතයන්ට උදව් වෙයි, වඩා හොඳ බෝග වගා කරන්නේ කෙසේ දැයි ගොවීනට කියා දෙයි, න්‍යෂ්ටික අවි ව්‍යාප්තියට මඟ අහුරයි. එ.ජා. සාම හමුදා රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියා මාර්ග සාර්ථක වීමටත් සාමය මුල් බැස ගැනීමටත් අවස්ථාව සලසා දෙති.*

*එක්සත් ජනපද ජනාධිපති*
*බිල් ක්ලින්ටන්*
*1997 ජනවාරි 23.*

# 2

# එක්සත් ජාතීන්ගේ පවුල : එක් එක් ආයතනය කරන්නේ කුමක් ද?

**එක්සත් ජාතීන්ගේ විවිධ ආයතනවල ප්‍රධාන කාර්යයන් මොනවා ද?**

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන (අවයව) හයක් ස්ථාපනය කැර ඇත. මේ ඒවායේ සංයුතිය හා කාර්යයන් පිළිබඳ සාරාංශයකි.

**මහා මණ්ඩලය :**

මහා මණ්ඩලය එක්සත් ජාතීන්ගේ කේන්ද්‍රීය ආයතනය යි. එහි දී සෑම ජාතියකටම ඕනෑම කරුණක් අරභයා කතා කිරීමටත් සවන් දීමටත් පිළිවන. එක්සත් ජාතීන්ගේ සියලු සාමාජිකයෝ ඊට අයත් වෙති. දුප්පත්, පොහොසත්, ලොකු කුඩා සෑම ජාතියකටම ඇත්තේ එක් ඡන්දයක් පමණි. වැදගත් ප්‍රශ්න පිළිබඳව තීරණය කරනු ලබන්නේ තුනෙන් දෙකේ වැඩි ඡන්දයෙනි. එක් රටකට ඇත්තේ එක් ඡන්දයක් වුවද එක් එක් රට නියෝජනය කැරෙන්නේ, බොහෝ විට කිහිප දෙනකුගෙන් සමන්විත දූත පිරිසක් විසිනි. තානාපතිවරයකුගේ මට්ටමේ රාජ්‍ය දූතයෙක් සාමාන්‍යයෙන්, එවැනි කණ්ඩායමක නායකත්වය දරයි.

*මහා මණ්ඩලය : නියෝජිතයන් 185 දෙනාම මුණ ගැසෙන මන්ත්‍රණ, සභා ශාලාව, මහා මණ්ඩලය සිය හත්වැනි නිත්‍ය සැසි වාරය ආරම්භ කරමින් 1952 ඔක්තෝබර් 14 වැනි ද ප්‍රථම වරට මෙහි දී රැස්විය.*



**තතු විමසුම:**
**එක රටකට**
**එක චන්දය යි**

*මහා මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම හිමි එක් ඡන්දයකි. මේ මූලධර්මය ලොකු කුඩා සියලු ජාතීනට එකසේ අදාලය. චීනයේ ජනගහනය කෝටි සියය ඉක්මවයි. රට හිමි එක් චන්දයකි. එක්සත් ජාතීන්ගේ කුඩාම සාමාජිකයා වන පාලවු රාජ්‍යයේ ජනගහනය 16.000කි. රට ද හිමි එක් චන්දයකි.*

මහා මණ්ඩලය නිතිපතා වසරකට වරක් රැස්වෙයි. සැප්තැම්බර් මාසයේ තුන්වැනි අඟහරුවාද ආරම්භ වන සැසිවාරය අඩුම වශයෙන් මාස තුනක් පැවැත්වෙයි. වසරේ වෙනත් කාලවල විශේෂ සැසිවාර සංවිධාන කළ හැකි ය. හදිසි රැස්වීම් ඕනෑම අවස්ථාවක කැඳවීමට පිළිවන.

මූලසුන හොබවමින් සැසිවාරය මෙහෙයවීම පිණිස මහා මණ්ඩලය සෑම වසරකම සභාපතිවරයකු තෝරා ගනී.

කවර හෝ විෂයයක් ගැන (දැනටමත් ආරක්ෂක මණ්ඩලය විසින් කටයුතු කැරෙන ඒවා හැර) සාකච්ඡා කිරීමටත්, නිර්දේශ ඉදිරිපත් කිරීමටත් මහා මණ්ඩලයට පිළිවන. සන්නද්ධ ගැටුම්, සාම සාධක මෙහෙයුම් සහ නිරායුධකරණය සම්බන්ධ ගැටළු නිතර සාකච්ඡාවට ලක්වෙයි. මහා මණ්ඩලය ළමයින්ගේ, තරුණයන්ගේ සහ ස්ත්‍රීන්ගේ තත්වය වැඩි දියුණු කළ හැකි ක්‍රම සහ විධි සොයා බලයි. ධරණීය සංවර්ධනය සහ මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්න ද සාකච්ඡාවට ලක්වෙයි. ඒ හැර, මහා මණ්ඩලය මහා ලේකම්වරයා වෙතින් ලැබෙන වාර්තා සේම ආරක්ෂක මණ්ඩලයෙන් සහ එක්සත් ජාතීන්ගේ සෙසු ආයතන වලින් ලැබෙන වාර්තා ද භාර ගනී; එය ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය අනුව නව සාමාජිකයන් ඇතුළත් කැර ගනී; ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහ ලේකම්වරයා පත් කරයි; සෙසු ආයතනවල සාමාජිකයන් තෝරා ගනී. මහා මණ්ඩලය එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරිත්වය උදෙසා එක් එක් සාමාජිකයා ගෙවිය යුතු මුදල සහ එසේ එකතු වන මුදල් වැය කළ යුතු ආකාරයත් තීරණය කරයි.




එක්සත් ජාතීන්ගේ රැස්වීමකට සහභාගිවන සමාජිකයෝ

මහා මණ්ඩලය සම්මත කොට ගන්නා **යෝජනා** සාමාජික රටවල නිර්දේශ පමණි. එසේ වුවද මහා මණ්ඩලය ලෝකයේ සෑම රටකම පාහේ හඬ සහ ජනමතය නියෝජනය කරන බැවින් මේ නිර්දේශ විශාල බලයක් ගැබ් කොට ගනී.

# එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන




**ආරක්ෂක මණ්ඩලය :-**

අරක්ෂක මණ්ඩලය සැලසුම් කරන ලද්දේ ලෝක සාමයේ ප්‍රධාන මුර දේවතාවා වනු අටියෙනි. ලෝක අවධානයට ලක්වන ඕනෑම කරුණක් සාකච්ඡා කිරීමට මහා මණ්ඩලයට හැකිවන අතර ආරක්ෂක මණ්ඩලය ක්‍රියා කරන්නේ සාමයට හා ආරක්ෂාවට අදාළ ගැටළු සම්බන්ධයෙන් පමණි.

ආරක්ෂක මණ්ඩලයේ තීරණ පිළි ගැනීමටත් ක්‍රියාත්මක කිරීමටත් එක්සත් ජාතීන්ගේ සියලු සාමාජිකයෝ එකඟ වී සිටිති.



*ආරක්ෂක මණ්ඩලය : මණ්ඩල සභා ගර්භය නෝර්වේ රාජ්‍යයෙන් ලැබුණු ත්‍යාගයකි. එය සැලසුම් කරන ලද්දේ නෝර්වීජියානු චිත්‍ර ශිල්පී ආන්ස්ටයින් ආනේබර්ග් විසිනි. අනාගත සාමය පිළිබඳ ප්‍රතිඥාව සහ පෞද්ගලික නිදහස සංකේතවත් කරමින් පර් ක්‍රොග් (නෝර්වේ) විසින් නිමවන ලද විශාල බිත්ති චිත්‍රයක්, නැගෙනහිර බිත්තියේ වැඩි කොටසක් වසා සිටී.*

ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෝ පසළොස් දෙනෙකි. ඔවුන්ගෙන් පස් දෙනෙක් ස්ථාවර සාමාජිකයෝ වෙති. ඔවුහු චීනය, ප්‍රංශය, රුසියානු ෆෙඩරේෂණය, එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය. ස්ථාවර නොවන සෙසු සාමාජිකයෝ දස දෙනා භූගෝලීය නියෝජනය පදනම්කොට ගෙන දෑ අවුරුදු කාල සීමාවක් සඳහා මහා මණ්ඩලය විසින් තෝරා ගැනෙති.

ආරක්ෂක මණ්ඩලය, මහා මණ්ඩලය මෙන් නිතිපතා රැස්වීම් පවත්වන්නේ නැත. ඒ වෙනුවට කෙටි දැනුම් දීමකින් ඕනෑම වේලාවක එය කැඳවීමට පිළිවන. එක්සත් ජාතීන්ගේ සාමාජිකයකු වන හෝ නොවන ඕනෑම රටකට හෝ මහා ලේකම්වරයාට හෝ යම් ආරවුලක් නැතහොත් සාමයට එල්ල වී ඇති තර්ජනයක් ආරක්ෂක මණ්ඩලයේ අවධානයට යොමු කළ හැකි ය.

සාමාජික රටවලට වරකට මාසයක කාලයක් සඳහා මණ්ඩලයේ සභාපති ධුරයට පත්වීමේ අවස්ථාව ලැබේ. ඉංග්‍රීසි හෝඩිය අනුව තම රටවල නම ලියැවෙන පිළිවෙලට ඔවුහු තෝරා ගැනෙති.

ආරක්ෂක මණ්ඩලයෙහි ඡන්දය දීමේ ක්‍රමය මහා මණ්ඩලයෙහි ඡන්දය දීමේ ක්‍රමයට වෙනස් ය. වැදගත් යෝජනාවක් ආරක්ෂක මණ්ඩලයෙන් සම්මත වීමට නම් සාමාජිකයන් නව දෙනකු පක්ෂව ඡන්දය දිය යුතු ය. එහෙත් ස්ථාවර සාමාජිකයන් 5 දෙනාගෙන් එක් අයකු හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළහොත් යෝජනාව සම්මත නොවන අතර ඔවුන් සතු මේ විශේෂ අයිතිය **නිෂේධ බලය** ලෙස හැඳින්වේ.

## ආර්ථික හා සමාජ මණ්ඩලය

ආර්ථික හා සමාජ මණ්ඩලය කෙටියෙන් ඉකොසොක් (ECOSOC) යන නාමයෙන් හඳුන්වනු ලැබේ. එය වෙළෙඳාම, ප්‍රවාහනය, කාර්මිකකරණය, සහ ආර්ථික සංවර්ධනය වැනි ආර්ථික ගැටළු සහ ජනගහනය, ළමයින්, නිවාස සම්පාදනය, ස්ත්‍රී අයිතිවාසිකම්, වාර්ගික වෙනස්කම්, විෂ මත්ද්‍රව්‍ය, අපරාධ, සමාජ සුභසාධනය, තරුණයන්, මානව සංවර්ධනය සහ ආහාර වැනි සමාජ ගැටළු පිළිබඳව අවධානය යොමු කරයි. එසේම අධ්‍යාපනය හා සෞඛ්‍ය තත්වයන් නැංවීම සඳහාත් සෑම තන්හිම වෙසෙන ජනයාගේ මානව අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස භාවිතය සහ ඒවාට ගරු කිරීම ප්‍රවර්ධනය කරනු වස් නිර්දේශ ඉදිරිපත් කරයි.

ඉකොසොක් සාමාජික සංඛ්‍යාව රටවල් 54 කි. ඒ සියලු දෙනාම මහා මණ්ඩලය විසින් වසර තුනක කාල සීමාවක් සඳහා තෝරා ගැනෙති.

මණ්ඩලය සාමාන්‍යයෙන් වසරකට වරක් රැස්වෙන අතර එහි තීරණ ගනු ලබන්නේ වැඩි ඡන්දයෙනි.

ආර්ථික හා සමාජ මණ්ඩලයේ විෂය පථය තනි ආයතනයකින් හැසිරවීමට නොහැකි තරමට පුළුල් බැවින් ඊට උපකාරී කොමිෂන් ගණනාවක් පිහිටුවා ඇත. ඉන් සමහරක් කාර්ය නියුක්ත කොමිෂන් ලෙස හැඳින්වෙන අතර ඒවා පහත සඳහන් සුවිශේෂ විෂයයන් අරභයා මණ්ඩලයට උපදෙස් දෙයි. ඒවා :

- මානව අයිතිවාසිකම් කොමිෂම
- විෂ මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිෂම
- සමාජ සංවර්ධනය පිළිබඳ කොමිෂම
- ජනගහනය හා සංවර්ධනයෙ පිළිබඳ කොමිෂම
- ස්ත්‍රීන්ගේ තත්වය පිළිබඳ කොමිෂම
- සංඛ්‍යාලේඛන කොමිෂම
- අපරාධ නිවාරණය සහ අපරාධ යුක්ති විනිශ්චය පිළිබඳ කොමිෂම
- ධරණීය සංවර්ධනය පිළිබඳ කොමිෂම
- සංවර්ධනය සඳහා විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ කොමිෂම

විවිධ භූගෝලීය කලාපවලට අදල සුවිශේෂ ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කරන **කලාපීය කොමිෂන් සභා පහක් ඇත.** ඒවා මෙසේය :

(i) අප්‍රිකාව පිළිබඳ ආර්ථික කොමිෂම (ECA)
(ii) යුරෝපය පිළිබඳ ආර්ථික කොමිෂම (ECE)
(iii) ලතින් අමෙරිකාව සහ කැරිබියානු ප්‍රදේශය පිළිබඳ ආර්ථික කොමිෂම (ECLAC)
(iv) ආසියා ශාන්තිකර ආර්ථික හා සමාජ කොමිෂම (ESCAP)
(v) බටහිර ආසියානු ආර්ථික හා සමාජ කොමිෂම (ESCWA)

ආර්ථික හා සමාජ මණ්ඩලය කාර්ය නියුක්ත සහ කලාපීය කොමිෂන් සභා මත පමණක් රඳ පවතින්නේ නැත. එය විශේෂිත ආයතන නමින් හඳුන් වනු ලබන සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ වැඩ සටහන් සමඟ ද එක්ව වැඩ කරයි. බොහෝ විට ඔව්හු සුවිශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස එක්ව වැඩ කරති.

එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන 14 කි. ඒ සෑම එකක්ම තමන්ගේම සාමාජිකත්වයක්, අයවැයක් සහ මූලස්ථාන සහිත වෙනම සංවිධානයක් වෙයි. මේ ආයතන ගැටළු අධ්‍යයනය කොට යෝජනා ඉදිරිපත් කරමින් තම විෂයය ක්ෂෙත්‍රය ඇතුළත සංවර්ධනය වන රටවලට උපකාර කරයි. ඒ ආයතන මෙසේය:

- අන්තර් ජාතික කම්කරු සංවිධානය (ILO)
- එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO)
- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO)
- ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
- ලෝක බැංකුව (WORLD BANK)
- අන්තර් ජාතික මූල්‍ය අරමුදල (IMF)
- අන්තර් ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO)
- විශ්ව තැපැල් සංගමය (UPU)
- අන්තර් ජාතික විදුලි සංදේශ සේවා සංගමය (ITU)
- ලෝක කාලගුණ විද්‍යා සංවිධානය (WMO)
- අන්තර් ජාතික සාමුද්‍රීය සංවිධානය (IMO)
- ලෝක බුද්ධිමය දේපල සංවිධානය (WIPO)
- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අන්තර් ජාතික අරමුදල (IFAD)
- එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO)

**සමාන එහෙත් එකිනෙකින් වෙන් වූ තවත් ආයතන දෙකකි එනම්:**

- අන්තර් ජාතික පරමාණුක බලශක්ති ආයතනය (IAEA)
- ලෝක වෙළෙඳ සංවිධානය (WTO)

සුවිශේෂ ක්ෂේත්‍රවල වැඩ කිරීම පිණිස මහා මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ **වැඩ සටහන්** සහ වෙනත් ආයතන නිර්මාණය කර ඇත. ඒවා ආර්ථික හා සමාජ මණ්ඩලය සමග සමීප සහයෝගයෙන් ක්‍රියා කරන අතර බොහෝ අවස්ථාවල මහා මණ්ඩලයට සහ ආර්ථික හා සමාජ මණ්ඩලයට වාර්තා ඉදිරිපත් කරයි. එකී වැඩ සටහන්. :

- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
- එක්සත් ජාතීන්ගේ සහන සේවා වැඩ ආයතනය (UNRWA)
- සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR)
- ලෝක ආහාර වැඩ සටහන (WFP)
- එක්සත් ජාතීන්ගේ පුහුණු සහ පර්යේෂණ ආයතනය (UNITAR)
- වෙළෙඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD)

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP)
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)
- එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහන (UNEP)
- එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලය (UNU)
- කාන්තාභිවෘද්ධිය සඳහා අන්තර් ජාතික පර්යේෂණ සහ පුහුණු ආයතනය (INSTRAW)
- එක්සත් ජාතීන්ගේ ජනාවාස කේන්ද්‍රය (UNCHS)

**භාරකාරත්ව මණ්ඩලය :**

එක්සත් ජාතීන් බිහි වූ අවධියේ ලෝකයේ ඇතැම් ප්‍රදේශවල ජනතාවන්ට නිදහස ලැබී නොතිබිණ. ඉන් සමහරක් ප්‍රථම ලෝක යුද්ධය අවසානයේ පිහිටුවන ලද **බල අධිකාර** යටතට පත් කොට තිබිණ. සෙසු එවා දෙවැනි ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස සතුරු රාජ්‍යයන්ගෙන් වෙන් කරනු ලැබී ය. එක්සත් ජාතීන් ස්ථාපනය කළ පසු මේ ප්‍රදේශ එක්සත් ජාතීන්ගේ විශේෂ ආරක්ෂාව යටතට පත් කැරුණු අතර එවා **භාර භූමි ප්‍රදේශ** ලෙස හඳුන්වන ලදි. මේ භූමි ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ සමාජ අභිවෘද්ධිය අධීක්ෂණය පිණිස එක්සත් ජාතීන්ගේ ආයතනයක් ලෙස භාරකාරත්ව මණ්ඩලය ස්ථාපනය කැරිණ. ආරම්භයේ දී එවැනි භූමි ප්‍රදේශ එකොළහක් විය.

ඉන් බොහොමයක් අප්‍රිකාවට සහ ශාන්තිකර සාගර ප්‍රදේශයට අයත් විය. භාරකාරත්ව මණ්ඩලය සමන්විත වූයේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සාමාජිකයන්ගෙන්, එනම් චීනය, ප්‍රංශය, රුසියානු ෆෙඩරේෂණය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන රටවලිනි. එක් සාමාජිකයකුට එක් ඡන්දයකි. තීරණ ගනු ලබන්නේ සරල බහුතරයෙනි.

භාරකාරත්ව මණ්ඩලය මැයි සහ ජුනි මාසවලදී සාමාන්‍යයෙන් වසරකට වරක් රැස්වෙයි. භාර භූමි ප්‍රදේශයේ පාලනය පැවරී ඇති රාජ්‍යයන් වෙතින් ලැබෙන වාර්තා අධ්‍යයනය කරන එය අදාල භූමි ප්‍රදේශය ස්වාධීනත්වය හෝ ස්වයං තීරණ අයිතිය හෝ ලැබීම සඳහා යොමු කරනු ලැබේදැයි පරීක්ෂා කොට බලයි; භාර භූමි ප්‍රදේශ කරන පැමිණිලි විමර්ශනය කරයි; කුමන උදව් අවශ්‍ය දැයි සොයා බැලීම පිණිස අදාල ප්‍රදේශ වෙත නියෝජිතයන් පිටත් කර හරී. අවසාන භාර භූමි ප්‍රදේශය-කලින් එක්සත් ජනපදය විසින් පාලනය කරන ලද පාලවු දිවයින - 1994 ඔක්තෝබර් මාසයේ දී ස්වයං පාලනය අත්කැර

ගැනීමෙන් අනතුරුව මණ්ඩලය අඩසිය වසකට ආසන්න කාලයකට පසු සිය ක්‍රියාකාරිත්වය නිල වශයෙන් අත්හිටුවී ය. අවශ්‍යතාවක් ඇති වූ විට පමණක් එය රැස්වනු ඇත.

එක්සත් ජාතීන් ස්වයංපාලන බලතල රහිත ප්‍රදේශවල ජනයා ගැන ද සැලකිලිමත් වෙයි. ඇතැම් විට යටත් විජිත ලෙස හැඳින්වෙන මෙකී ප්‍රදේශ පාලනය කරන රට විසින් ඒවායේ වෙසෙන ජනතාවගේ කටයුතු තීරණය කරනු ලැබේ. භාරකාරත්ව මණ්ඩලය අධීක්ෂණය කළේ භාර භූමි ප්‍රදේශ පමණක් බැවින් සියලු යටත් විජිතවලට සහ ඒවායේ ජනතාවන්ට කඩිනමින් ස්වාධීනත්වය ප්‍රදානය කරන්නැයි ඉල්ලමින් මහා මණ්ඩලය 1960 දී ප්‍රකාශයක් සම්මත කළේ ය. ඊට පසු වර්ෂයේ දී නිර්යටත්විජිතකරණය පිළිබඳ විශේෂ කමිටුව පිහිටුවන ලදි. මෙකී යටත් විජිත පාලනය කරන රටවල් නිර්යටත්විජිතකරණය සහ ඒවායේ පවත්නා තත්වය පිළිබඳ වාර්තා නිතිපතා විශේෂ කමිටුව වෙත ඉදිරිපත් කරයි. ප්‍රකාශනය සම්මතවීමෙන් පසු යටත්විජිත 60 ක් පමණ ස්වාධීනත්වය ලැබ එක්සත් ජාතීන්ගේ සාමාජිකයන් බවට පත්වූහ.

**අන්තර් ජාතික අධිකරණය :**

අන්තර් ජාතික අධිකරණය නෛතික තීන්දු දීමේ කාර්යය භාර එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනය වන්නේ ය. අධිකරණය හමුවේ නඩු පැවරිය හැක්කේ පුද්ගලයනට නොව රටවලට පමණි. නඩුවක් විභාග කිරීමට අධිකරණයට ඉඩදීමට කිසියම් රටක් එකඟ වූ විට අධිකරණයේ තීරණයට කීකරු වන බවට එරට ප්‍රතිඥා දිය යුතු ය. ඒ හැර එක්සත් ජාතීන්ගේ සෙසු ආයතනවලට අධිකරණයේ උපදේශාත්මක මතය පැතීමට පිළිවන.

නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි අන්තර්ජාතික අධිකරණය බොහෝ ආරවුල් සමථයකට පත් කිරීමට සහාය වී ඇත. 1992 දී එය එල් සැල්වදෝරය සහ හොන්දුරාසය අතර ගොඩබිම් සහ සාමුද්‍රීය සීමා නිර්ණය පිළිබඳව නිගමනය කළේ ය. ඩෙන්මාර්කය සහ නෝර්වේ රාජ්‍යය අතර මහාද්වීපික තටාකය සහ ධීවර කලාපය වෙන් කරන්නා වූ මුහුදු සීමාව සම්බන්ධ ආරවුලක් ද අධිකරණය විසින් සමථයකට පත් කරන ලදි. අධිකරණය මෑතකදී දුන් තවත් තීන්දුවක් මගින් වර්ග සංහාරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියක් පැරණි යුගෝස්ලාවියාවට අයත් රටවල භාවිතයට නැගීමට තීරණය කෙරිණ. (1993)

අධිකරණය ස්ථාවර සැසිවාර සඳහා නෙදර්ලන්තයේ හේග් නුවරදී



අන්තර් ජාතික අධිකරණය නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටා ඇත.

රැස්වෙයි. එහි විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයන් 15 දෙනෙකි. ඔවුන් තෝරා ගනු ලබන්නේ මහා මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩලය විසිනි. එකම රටකින් විනිශ්චයකරුවන් දෙදෙනකු පත් යළ නොහැකිය. තීරණයක් ගැනීමට විනිශ්චයකාරවරුන් 9 දෙනෙක් එකඟ විය යුතු ය.

**ලේකම් කාර්යාලය :**

එක්සත් ජාතීන් විසින් සේවයට බඳවාගත් සියලු දෙනා ලේකම් කාර්යාලයේ සාමාජිකයෝ වෙති. එහි ප්‍රධානියා මහ ලේකම් වරයා යි. එක්සත් ජාතීන්ගෙ එදිනෙද කාර්යයන් ඉටු කරන අන්තර් ජාතික සිවිල් සේවකයන්ගෙන් සැදුම් ලත් කාර්ය මණ්ඩලයක් ඔහුට සහාය වෙයි. එක්සත් ජාතීන්ගේ සෙසු ආයතනවලට සේවය කිරීමත් එකී ආයතන විසින් නිර්දේශිත වැඩ සටහන් සහ ප්‍රතිපත්ති පරිපාලනයත් ලේකම් කාර්යාලයේ වගකීමකි.

ලේකම් කාර්යාලයීය සාමාජිකයෝ විවිධ ගැටලු පිළිබඳ පසුබිම් තොරතුරු එක්රැස් කොට පිළියෙල කොට තබති. එබැවින් ආණ්ඩුවල නියෝජිතයනට තතු අධ්‍යයනය කොට සිය නිර්දේශ ඉදිරිපත් කිරීම පහසු වෙයි. ලේකම් කාර්යාලය එක්සත් ජාතීන්ගේ තීරණ ක්‍රියාත්මක කිරීමටද සහාය වෙයි.

එක්සත් ජාතීන්ගේ පද්ධතිය සමස්තයක් වශයෙන් ගත්කල - එනම්

නිව්යෝක් හි ලේකම් කාර්යාලය සහ කලාපීය කාර්යාල, විශේෂිත ආයතන සහ වැඩ සටහන් - ලොව පුරා 50,000 කට අධික පිරිසක් සේවයේ යොදා ගනී. ඔවුන්ගෙන් 4800 පමණ දෙනා නිව්යෝක් නුවර මූලස්ථානයේ සේවය කරති. ආර්ථික විද්‍යාඥයෝ, නීතිඥයෝ, සංස්කාරකවරු, පුස්තකාලායාධිපතිරු, භාෂා පරිවර්තකයෝ සහ බොහෝ ක්ෂෙත්‍රවල තිරයෙන් පිටු පස වැඩ කරන්නා වූ විශේෂඥයෝ ඔවුනට අයත් වෙති. සියලු කලාප නියෝජනය වීම සහතික කරනු වස් එක්සත් ජාතීන් හැකි තරම් විවිධ රටවලින් සුදුසුකම් ලත් පිරිස් සේවයට බඳවා ගනී. වෘත්තීය කාර්ය මණ්ඩලයට සුදුස්සන් තෝරා ගැනීම සඳහා නීතියක් වශයෙන්ම තරග විභාග ක්‍රමය භාවිත කෙරේ. එක්සත් ජාතීන්ගේ පිරිස් බල කාර්යාල, සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගේ ලේඛන තබා ගන්නා, අතර සුදුසුකම් ලත් ඕනෑම් පුද්ගලයකු ලේකම් කාර්යාලයේ රැකියාවට තෝරා ගැනීම පිණිස සලකා බලනු ලැබිය හැකි ය.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්-යාලය සාමාජික රටවල සහයෝගි-තාවයෙන් ඉදිකරන ලදී. එය සැලසුම් කරන ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේ ගෘහ නිර්මාණ ශිල්පී වොලස් කේ. හැරිසන් ප්‍රධාන ලෝ පතළ ගෘහ නිර්මාණ ශිල්පීන් කණ්ඩායමක් විසිනි.





## එක්සත් ජාතීන්ගේ ධජය

## තතු විමසුම :

මේ එක්සත් ජාතීන්ගේ ධජයයි. එහි නිල් පැහැ පසු බිමෙක මධ්‍යයේ ධවල ලාංඡනය ඇත. ලාංඡනයෙහි ඔලිව් අතුවලින් වට වූ ලෝක සිතියමකි. ඉන් ලෝක සාමය කුළු ගැන්වෙයි. එක්සත් ජාතීන්ගේ ධජය නිර්මාණය කිරීමේ දී ලාංඡනය ධජයේ පළලින් අඩක් වන සේ හරි මැද තිබිය යුතුය. මහා මණ්ඩලය 1947 ඔක්තෝබර් 20 ද ධජයේ සැලැස්ම අනුමත කෙළේ ය.

# 3

# සාමය හා ප්‍රගතිය උදෙසා එක්සත් ජාතීන්ගේ කාර්ය සාධනය

**1. එක්සත් ජාතීන් ස්ථාපනය කරන ලද්දේ සාමය පවත්වා ගැනීම උදෙසාය. මේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කරන්නේ කෙසේ ද?**

එක්සත් ජාතීන්, ලෝකයේ රටවලට යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්න ඇතුළුව අතිශය ගැටළු සහගත මාතෘකා ඉස්මතු කිරීමට හා සාකච්ඡා කිරීමට ජගත් සංවාද මණ්ඩපයක් සපයා දෙයි. ආණ්ඩු නායකයන් එකිනෙකාට මුහුණ ලා කතා කරන විට සංවාදයක් ඇරඹෙයි. බොහෝ විට එබඳු සංවාද ආරවුල් සාමකාමී ලෙස සමතයකට පත් කිරීමට ඉවහල් වෙයි. කෙළින්ම හෝ නියෝජිතයකු මගින් හෝ එවැනි සංවාදයකට මුල පිරීමට මහ ලේකම්වරයාට ද පිළිවන.

එවැනි ප්‍රයත්න අසාර්ථක වූ විට භාවිත කළ හැකි වෙනත් විධික්‍රම එක්සත් ජාතීන් සතුව තිබේ. නොසන්සුන්තාව සමනය කරන ලෙස ආදළ රටවලින් ඉල්ලා සිටීමටත් ප්‍රචණ්ඩ ක්‍රියාවක් හෙළා දැකීමටත් මහා මණ්ඩලයට පිළිවන. බොහෝ රටවල් එක හඬින් කතා කරන විට සවන් දෙන ලෙස එල්ල වන බලපෑම ආණ්ඩුවලට දැනෙයි. යුධ වැදුනු රටවල් නිසි මගට ගැනීමට මේ ක්‍රමයෙන් නොහැකිවුව හොත් ආරක්ෂක මණ්ඩලය මැදිහත් වෙයි. අධිකාරී බලයක් සහිත එහි තීරණය සටන්විරාමයක් සඳහා කැරෙන ඉල්ලීමක සිට ආර්ථික හා යුධ සම්බාධක පැනවීම දක්වා පරාසයක විහිදෙයි. සටන් විරාමයක් ඇති කරගත් විට සටන් විරාමය නිරීක්ෂණය කිරීමත් ගැටුම සාමකාමී ලෙස නිරාකරණය සඳහා සාකච්ඡා කිරීමට උදව් වීමත් පිණිස සාම සාධක මෙහෙවරක් ආරම්භ කිරීමට ආරක්ෂක මණ්ඩලයට හැකිය.

**2. එක්සත් ජාතීන් කුමන හෝ යුද්ධයක් නතර කර තිබේ ද?**

බොහෝ ගැටුම් පූර්ණ යුද්ධ බවට ඇවිලී යාම වලක්වාලීමට එක්සත් ජාතීන් උදව් වී ඇත. එය සාකච්ඡා මගින් ගැටුම් වලට සාමකාමී විසඳුම් ලබා දී තිබේ. එක්සත් ජාතීන් අවස්ථා ගණනාවක දී හදිසි තත්වයන් සමනය කිරීමට යන්ත්‍රණයක් සපයා ඇත. බර්ලින් අර්බුදය (1948-1949) කියුබානු මිසයිල අර්බුදය (1962) සහ 1973 මැද පෙරදිග අර්බුදය නිදසුන් කිහිපයකි. මේ සෑම අවස්ථාවකදීම සුපිරි බලවතුන් අතර යුද්ධයක් වැලැක්වීමට එක්සත් ජාතීන්ගේ මැදිහත් වීම උපකාරී විය.

කොන්ගෝවේ (1964) ඉරානය සහ ඉරාකය අතර (1988) සහ ඇෆ්ගනිස්ථානයේ (1989) යුද්ධ අවසන් කිරීමට එක්සත් ජාතීන් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කෙළේ ය. මෑත කාලයේ දී එකසත් ජාතීන්ගේ අන්තර් කාලීන සහායක කණ්ඩායම (UNTAG) නැමීබියාවේ ප්‍රථම නිදහස් හා සාධාරණ මැතිවරණ නිරීක්ෂණය කොට රට ස්වාධීනත්ව යට මගපාද දුන්නේය. කාම්බෝජයේ එක්සත ජාතීනගේ අන්තරකාලීන අධිකාරිය (UNTAC) සටන් විරාමයක් සහ විදේශ හමුද ඉවත් කිරීම අධීක්ෂණය හා නිරීක්ෂණය කොට ආණ්ඩුවේ විවිධ කාර්යාල අධීක්ෂණය හා නිරීක්ෂණය හා පාලනය කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සංවිධාන කළේ ය.

පැරණි යුගෝස්ලාවියොවේ දී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක බලකාය (UNPROFOR) යුද මුක්ත කාලපවල විසූ සාමාන්‍ය ජනයාට රැකවරණය සැලසීමට ක්‍රියා කරමින් මානුෂවාදී ආධාර සැපයීම පහසු කෙළේය.

**තතු විමසුම :**

***කාම්බෝජය යළි ගොඩ නැගීම***

*කාම්බෝජයේ සිවිල් කෝලාහල ආරම්භ වූ විට දහස් සංඛ්‍යාත ජනයා ගේ දෙර අතහැර අසල් වැසි තායිලන්තයට පලා ගියහ. එක්සත් ජාතීන් තනාදුන් තාවකාලික නිවහන් වල ඔවුහු වසර ගණණාවක් වාසය කළහ. ගැටුම් අවසන් කොට නව මැතිවරණ පැවැත්වීමට පසුබිම සැලැසෙන ගිවිසුමක් එක්සත් ජාතීන්ගේ මැදිහත් වීමෙන් 1991 දී ඇතිකර ගන්නා ලදි. මෙහිලා එක්සත් ජාතීනට මුහුණ පෑමට සිදුවූ අභියෝග බොහෝය : මැතිවරණ සංවිධාන කොට පැවැත්වීම, ආණ්ඩුවේ කාර්යාල පරිපාලනය, සාමය පවත්වා ගැනීම, සහ සරණාගතයන් යළි ගෙන්වා ගෙන පුනරුත්ථාපන කිරීම.*

*දෙවසරකට පසු 1993 මැයි මාසයේදී මැතිවරණ පවත්වා නව ආණ්ඩුවක් ස්ථාපනය කෙරිණ. දැන් කම්බෝජයේ යුද්ධය අවසන් වී ඇත. සරණාගතයන්ගෙන් ඉතා වැඩි පිරිස ආපසු පැමිණ සිටිති. කාම්බෝජ ජනයා එක්සත් ජාතීන්ගේ උදව් ඇතිව තම විනාශ වූ දේශය යළි ගොඩනැගීමේ යෙදී සිටිති.*

### 3. රටක් එක්සත් ජාතීන්ගේ තීරණයක් නොසලකා සිටින විට සිදු වන්නේ කුමක් ද? සිය තීරණ බලහත්කාරයෙන් ක්‍රියාත්මක කරවීමට එක්සත් ජාතීනට කිසි විටකත් හැකියාවක් තිබේ ද?

ආරක්ෂක මණ්ඩලයේ තීරණවලට අවනත නොවන විට ඒවා ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් පියවර ගණණාවක් ගැනීමට ර්ට පිළිවන. පළමුව උපදේශාත්මක මතය විමසීම පිණිස ප්‍රස්තුත කරුණ අන්තර්ජාතික අධිකරණය වෙත යොමු කළ හැකි ය.

දෙවනුව, රටක් සාමය කඩ කරන්නේ නම් හෝ සාමයට තර්ජනයක් වන පරිදි හැසිරෙන්නේ නම් නැතහොත් ආක්‍රමණකාරී ක්‍රියාවක නිරත වන්නේ නම්, ආර්ථික හා වෙනත් සම්බාධක පැනවීමට පිළිවන. ඇතැම් අවස්ථාවල බලය යෙදවීම සඳහා අවසර දීමට ද ආරක්ෂක මණ්ඩලයට පිළිවන. එහෙත් මේ ක්‍රියා මාර්ග ගනු ලබන්නේ ආරවුලක් සමතයකට පත් කිරීමේ සියලු සාමකාමී මාර්ග අසාර්ථක වීමෙන් පසු අවසන් පියවරක් වශයෙන් පමණි.

1966 දී රොඩේෂියාවේ (දැන් සිම්බාබ්වේ) සුදු ජාතික සුළුතර පාලනයට එරෙහිව ආර්ථික සම්බාධක පනවන ලදි. වර්ණභේද වාදය නම් වූ වර්ග විභේදන පිළිවෙතක් අනුගමනය කළ දකුණු අප්‍රිකාවේ සුදු ජාතික සුළුතර පාලනයට එරෙහිව අවි තහනමක් පැනවීම 1977 දී සිදු කෙරිණ. මෑත කාලයේදී ලිබියාව, සෝමාලියාව, යුගෝස්ලාවියාව, ඉරාකය, හයිටි, රුවන්ඩාව, ලයිබීරියාව යන රටවලට සහ ඇන්ගෝලාවේ ඇතැම් ප්‍රදේශවලට එරෙහිව සම්බාධක පැනවිණ.

### 4. එක්සත් ජාතීනට යුධ හමුදවක් සිටි ද?

නැත. එක්සත් ජාතීනට ස්ථාවර අන්තර්ජාතික පොලීසියක් හෝ යුධ බලකායක් හෝ නැත. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අනුව එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගනු පිණිස සන්නද්ධ හමුද පහසුකම් සහ උදව් ආරක්ෂක මණ්ඩලයට සපයා දිය යුතුය.

### 5. තමන්ගේම යුධ හමුදවක් නැතිව එක්සත් ජාතීන් යුධවදින කණ්ඩායම් අතර සාමය පවත්වා ගන්නේ කෙසේ ද?

සාම සාධක මෙහෙයුම් සඳහා එක්සත් ජාතීන් උපයෝගී කොට ගන්නා පොලිස් සහ හමුද බලකායන් සමන්විත වන්නේ සාමාජික රටවලින් ස්වේච්ඡාවෙන් සැපයෙන කණ්ඩායම් වලිනි. සාම සාධක භටයන් භාවිත කරන ආයුධ සහ බර උපකරණද සාමාජික රටවලින්ම



*සරණාගතයෝ යළි සිය නිවෙස් බලා යති. ඔවුහු එක්සත් ජාතීන්ගේ ආධාරයෙන් නැවත සිය ගම්බිම්වල පදිංචි වූහ.*

සැපයේ. බොහෝ විට එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සැදුම්ලත් සිවිල් සේවකයෝ ද මෙබඳු මෙහෙයුම්වල දී ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරති.

## 6. සාම සාධක මෙහෙයුමක් යනු කුමක් ද?

ප්‍රතිවාදී රටවල් අතර ගැටුම් පාලනයට හා සමනයට සහාය වනු පිණිස එක්සත් ජාතීන්ගේ විධානය යටතේ බහුජාතික හමුද උපයෝගි කොට ගැනීම සාම සාධනය ලෙස සාමාන්‍යයෙන් නිර්වචනය කර ඇත. සටන් විරාමයක් ඇති කිරීමට හා පවත්වා ගැනීමටත් ගැටුමේ පාර්ශවයන් අතර සටන් මුක්ත කලාප ඇති කිරීමටත් සහාය වන වැදගත් තුන්වන පාර්ශවයක කාර්ය භාරය සාම සාධක මෙහෙයුම් විසින් සපුරාලනු ලැබේ. රාජ්‍ය තාන්ත්‍රික මාර්ග ඔස්සේ ගැටුමට සාමකාමී විසඳුමක් සෙවීමේ ප්‍රයත්නය පහසු කිරීමට එය ඉවහල් වෙයි. සාම සාධක බලකාය පසුබිමේ සාමය පවත්වා ගන්නා අතර එක්සත් ජාතීන්ගේ දූතයෝ ගැටුමේ පාර්ශවකාර කණ්ඩායම් වල හෝ රටවල හෝ නායකයන් හමු වී ප්‍රශ්නයට සාමකාමී විසඳුමක් සෙවීමට උත්සාහ කරති.

සාම සාධක මෙහෙයුම් දෙවර්ගයකි. **නිරීක්ෂණ දූත මෙහෙවර** සහ **සාම සාධක හමුද.**

නිරීක්ෂකයෝ අවි නොදරති. සැහැල්ලු ආයුධ රැගෙන යන එක්සත් ජාතීන්ගේ සාම හමුදු සෙබළු එවා භාවිත කරන්නේ ආත්මාරක්ෂාව සඳහා පමණි. එක්සත් ජාතීන්ගේ අධිකාර චිහ්නය සහ සේවයේ නිරතව සිටින විට පළඳින නිල් හිස්වැස්ම නිසා එක්සත් ජාතීන්ගේ සාම සාධකයන්

*එක්සත් ජාතීන්ගේ සාම සාධක සෙබළු*



පහසුවෙන්ම හඳුනා ගත හැකිය. එක්සත් ජාතීන්ගේ සාම සාධකයන්ගේ සංකේතයක් බවට පත්ව ඇති නිල් හිස් වැස්ම සියලු මෙහෙයුම් වලදී රැගෙන යන අතර අන්තරායක් ඇති විට පළඳිනු ලැබේ. සාම හමුද සෙබළු සිය ජාතික නිල ඇඳුම හැඳ සිටිති. ස්වේච්ඡාවෙන් සෙබළුන් සපයන ආණ්ඩු එක්සත් ජාතීන්ගේ ධජය යටතේ සේවය කරන තම හමුදු භට පිරිස් පිළිබඳ අවසාන අධිකාරය දරා සිටී.

සාමාන්‍යයෙන්, ආරක්ෂක මණ්ඩලය සාම සාධක මෙහෙයුම් ස්ථාපනය කරන අතර සෑම විටම එවා මෙහෙයවනු ලබන්නේ මහා මණ්ඩලය විසිනි. සාම සාධක මෙහෙයුම් වලට, අදාළ ආණ්ඩුවල අනුමැතිය අවශ්‍යයෙන්ම තිබිය යුතුය. එසේම බොහෝ විට සෙසු කණ්ඩායම්වල සහභාගිත්වය ද තිබිය යුතුය. සෙබළු සහ සිවිල් පිරිස් අත්‍යන්තයෙන්ම අපක්ෂපාතී විය යුතුවාක් මෙන්ම කිසි විටෙකත් තමන් රැඳී සිටින රටේ අභ්‍යන්තර කටයුතු වලට මැදිහත් නොවිය යුතුය.

සාම සාධනය ආරම්භ වන්නේ අර්බුදයක් උද්ගත වූ විට පමණක් නමුදු සාම ප්‍රයත්නය පටන් ගන්නේ ඊට බොහෝ කලිනි. නව ගැටුම් පැන නැගීම හෝ පවතින ගැටුම් යුද්ධ බවට වර්ධනය වීම හෝ වලක්වා ගැනීමට විවිධාකාරයෙන් උත්සාහ කිරීමට එක්සත් ජාතීනට පිළිවන. අදාළ පාර්ශවයන් සමග පෞද්ගලික සම්බන්ධතා ඇති කර ගැනීම, මහ ලේකම්වරයාගේ "සද් භාවය" ප්‍රයෝජනයට ගැනීම, තතු සෙවීමේ දූත කණ්ඩායම් පිටත්කර යැවීම එ අතරවෙයි. මෙබඳු ක්‍රම **නිවාරණීය රාජ්‍යතාන්ත්‍රික උපාය** ලෙස හැඳින් වෙයි.

> ***සාම සාධනයේ අරුත හෙද සාත්තුව සැලසීමයි.***
>
> *"සාම සාධනය රෝහලක කාර්ය මණ්ඩලය රෝගියකුගේ උණ බස්සවා ඔහු හැකි පමණ සෞඛ්‍ය සම්පන්නව තබා ගැනීම බඳුය. ඔබ යම් දුරක් ගිය විට වෛද්‍ය විශේෂඥයකු පැමිණ ප්‍රශ්නය විසඳනු ඇත."*
>
> *ශ්‍රීමත් බ්‍රයන් උර්ක්හාට් එක්සත් ජාතීන්ගේ අනු මහ ලේකම්.*

## 7. එක්සත් ජාතීන් මෙතරම් සාම හමුද මෙහෙයුම් ක්‍රියාත්මක කරන්නේ ඇයි ?

සාම සාධක මෙහෙයුම් ස්ථාපනය කෙරෙන්නේ බරපතල යුධ හෝ මානුෂවාදී හෝ අර්බුද වලට ප්‍රතිචාර වශයෙනි. අතීතයේදී සාම සාධක හමුද වැඩි වශයෙන් නිරත වුයේ යුධ වැදුණු ජාතීන් අතර සාමය පවත්වා ගැනීමට ය. එහෙත් අද බොහෝ ජාතීහු තමන් අතරම යුධ වැදී සිටිති. සිවිල් කෝලාහල සහ ජනවාර්ගික ගැටුම් හේතුවෙන් සමහර ආණ්ඩුවලට තමන්ගේම

දේශයේ ඇතැම් කොටස්වල සිය අධිකාරය පවත්වා ගැනීමට නොහැකි වී තිබේ. මේ තත්වය ජනතාවට මහත් දුක් පීඩා ඇති කරයි. එබඳු අවස්ථාවල විසඳුමක් පිළිබඳව සාකච්ඡා කරන ලෙස එක්සත් ජාතීන්ගෙන් බොහෝ විට ඉල්ලා සිටිනු ලැබේ. අනෙක් අතට ගැටුමෙන් විපතට පත් ජනයාට හදිසි සහනාධාර සපයන ලෙස ඉල්ලීම් කෙරේ. එක්සත් ජාතීන් දුෂ්කර තත්වයන් යටතේ වැඩ කරමින් මානුෂවාදී සහන සේවා, අර්බුදය විසඳීමේ ප්‍රයත්න සමග ඒකාබද්ධ කරයි.

නිදසුනක් ලෙස පැරණි යුගෝස්ලාවියාවේ ඇතැම් ප්‍රදේශවල විවිධ කණ්ඩායම් කටුක කලාපීය යුද්ධයක පැටලුණු කල දහස් සංඛ්‍යාත ජනයා මරණයට පත්වූහ. නැතහොත් තුවාල ලැබූහ. තවත් විශාල පිරිසකට උන්හිටි තැන් අහිමි විය. එක්සත් ජාතීන් ඊට ප්‍රතිචාර වශයෙන් 1992 දී **එක්සත් ජාතීන්ගේ ආරක්ෂක බලකාය** (UNPROFOR) ස්ථාපනය කළේය. සාම සාධක මෙහෙවරක් ලෙස එය සාමකාමී වතාවරණයක් ඇති කිරීමටත් බොස්නියා හර්සෙගොවිනාහි ජනතාවට මානුෂවාදී සහන සැලසීම සහතික කිරීමටත් උපකාරී විය. එසේම සිවිල් කෝලාහල නිසා ව්‍යසනයට පත් තවත් රටක් වන සෝමාලියාවේ **එක්සත් ජාතීන්ගේ සෝමාලියා මෙහෙයුම** (UNOSOM) ස්ථාපනය කොට විවිධ ප්‍රතිවාදී කණ්ඩායම් අතර සටන් විරාමය නිරීක්ෂණය කරමින් හදිසි සහනාධාර සම්පාදනයට හවුල් වූයේ ය.



*සරණාගත කඳවුරක වෙසෙන නිවාස අහිමිවූ ළමයින් පිරිසක්*

**තතු විමසුම :**

**යුධ අවියෙන් අත්පා**

*නිකරගුවාහි ජනතාව දහස් සංඛ්‍යාත ජීවිත බිලි ගත් කටුක සිවිල් යුද්ධයකට මැදිව දිවි ගෙවූහ. 1990 දී එක්සත් ජාතීන්ගේ මධ්‍යම අමෙරිකානු නිරීක්ෂණ කණ්ඩායම නමැති සාම සාධක මෙහෙවර ප්‍රතිවාදී කණ්ඩායම් අතර සාම ගිවිසුමක් ඇති කර ගැනීමට උදව් කෙළේය. පසුව දහස් ගණන් කැරලිකාර සෙබළු නිරායුධ කිරීමට සහය වූ එය ඔවුන් සතු අවි ආයුධ එකතු කෙළේය.*

*නිරායුධ කිරීම අවසන් වූ විට අවි ආයුධ මහා කන්දක් ඉතිරි විය. ඒවාට කුමක් කරන්නේද? පිළිතුර සරල එකක් විය. කැබලි කළ ආයුධ ටොන් ගණනක් පුනරුත්ථාපන සායන වෙත ප්‍රදානය කිරීමට එක්සත් ජාතීන් තීරණය කළ අතර ඒවා භාවිත කොට කෘත්‍රිම අත්පා නිපදවිණ. යුද්ධය නිසා අත් පා අහිමි වූ සාමාන්‍ය වැසියනට ඉන් ප්‍රතිලාභ අත්විය.*

*එල්බා ගර්සියා, කැබලි කළ අවි වලින් තැනූ කෘත්‍රිම බාහුවක් තැගි ලැබූ පළමු ආබාධිතයා විය. "මට මගේ අත අහිමි කළ රයිපලය මට අලුත් අත් දී මගේ ජීවිතය වෙනස් කිරීම මට අදහා ගන්නත් බැහැ" යනුවෙන් පසුව ඇය පැවසුවාය.*

*මධ්‍යම අමෙරිකාවේ එක්සත් ජාතීන්ගේ සාම හමුදාවට පැවරුණු එක් කාර්යයක් වූයේ නිරායුධ කෙරුණු සෙබළුන්ගෙන් එකතු කර ගත් ආයුධ විනාශ කිරීමයි.*

## 8. ඉරාක -කුවේට් රාජ්‍යයන්හි "කාන්තාර කුණාටුව" නමැති මෙහෙයුම සාම සාධක මෙහෙවරක් ද?

නැත. මේ මෙහෙයුම ආරක්ෂක මණ්ඩලය විසින් අනුමත කෙරුණු එකක් වුවද එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙවරක් ලෙස සැලකෙන්නේ නැත. "කාන්තාර කුණාටුව" මෙහෙයුම සිදු කරන ලද්දේ එක්සත් ජනපදය ප්‍රමුඛ සන්ධානයක් විසිනි. ඉරාක හමුද කුවේටයෙන් පිටමං කරනු වස් "අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග" ගැනීමට සාමාජික රටවලට බලය දුන් 1990 නොවැම්බර් මස ආරක්ෂක මණ්ඩල යෝජනාව අනුව එය සංවිධාන කෙරිණ.

1950 දී කොරියාවේ ද සමාන තත්වයක් උද්ගත විය. ප්‍රදේශයේ යුද්ධයක් ආරම්භ වූ විට "කොරියානු ජනරජයට එරෙහිව එල්ල වූ සන්නද්ධ ප්‍රහාරය ව්‍යාර්ථ කිරීමට ඊට හැකිවන පරිදි උපකාර සැලසීමට "සාමාජික රටවලට අවසර දුන් ආරක්ෂක මණ්ඩලය හමුද සහ වෙනත් උපකාර සපයන රාජ්‍යයන් එසේ කළ යුත්තේ "එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුත් ඒකාබද්ධ අධිකාරිය" මගින් බව ප්‍රකාශ කළේය.

සෝමාලියාවේ (1992), රුවන්ඩාවේ (1994), සහ හයිටි රාජ්‍යයේ (1994) හටගත් සංකීර්ණ යුධ හා මානුෂවාදී අර්බුද සමනය පිණිස "අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග" උපයෝගී කරගන්නා ලෙසද ආරක්ෂක මණ්ඩලය සාමාජික රටවලට අනුමැතිය දුන්නේ ය. මේ එක් එක් අවස්ථාවේ දී එක් සාමාජික රාජ්‍යයක් හෝ වැඩි ගණනක් සාමය උදකොට සාමාන්‍ය වැසියන් අන්තරායෙන් මුද ගැනීමේ අන්තර් ජාතික ප්‍රයත්නයට ආධාර දී ඇත. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් මගින් මේ ප්‍රයත්නයන් ඉදිරියට ගෙන යනු ලැබී ය.

## 9. සාමය උදෙසා එක්සත් ජාතීන් වෙන මොනවාද කරන්නේ ?

එක්සත් ජාතීන් සාමය උදෙසා කරන වැඩ කොටස සාම හමුද මෙහෙවරක සාර්ථක නිමාව සමග අවසන් වන්නේ නැත. සන්නද්ධ ගැටුමකට පසුව අවතැන් වූවනට සහ සරණාගතයනට යළි සිය නිවෙස් වෙත යාමට එක්සත් ජාතීන් උදව් කරයි. එය බිම්බෝම්බ ඉවත් කොට මාර්ග සහ පාලම් අළුත් වැඩියා කොට දෙයි : ආර්ථිකය යළි ගොඩ නැගීම පිණිස ආර්ථික හා තාක්ෂණික ආධාර සපයයි. එසේම මැතිවරණ නිරීක්ෂණය කරමින් ඒ ඒ රට තම වැසියන්ගේ මානව අයිතිවාසිකම් වලට ගරු කරන්නේ කෙසේදැයි විමසිල්ලෙන් බලා සිටී. සාමය-ගොඩනැගීම යනුවෙන් ද හඳුන්වන මේ ක්‍රියා දමය ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ගොඩනගා ගැනීම සඳහා රටවල් 60 කට වැඩි ගණනකට සහාය වී ඇත.

සන්නද්ධ හමුදවල ප්‍රමාණය අඩු කිරීමට දිරි ගැන්වීමෙන් නිරායුධකරණය සාර්ථක කර ගැනීමට ද එක්සත් ජාතීන් වෙහෙසෙයි. ඇතැම් සාම සාධක මෙහෙයුම් වලදී ආයුධ කැබලි කොට විනාශ කිරීම පවා සිදු කෙරිණ. මේ ප්‍රයත්නයෝ අවි පාලන ගිවිසුම් ගණනාවකට ප්‍රභවය දුන්හ. අවි අත්හද බැලීම හෝ හමුද පහසුකම් ඉදිකිරීම හෝ සඳහා ඇන්ටාක්ටිකා කලාපය භාවිත කිරීම තහනම් කළ **ඇන්ටාක්ටික් සම්මුතිය** (1959) ඊට නිදසුනකි. **ජෛව විද්‍යාත්මක සහ විෂමුසු අවි පිළිබඳ සම්මුතිය (1972)** එබඳු අවි විනාශ කිරීම දිරිගන්වයි. **රසායනික අවි සම්මුතිය,** රසායනික අවි නිෂ්පාදනය, භාවිතය සහ ව්‍යාප්තිය තහනම් කරයි. **න්‍යෂ්ටික අවි පරීක්ෂණ සපුරා තහනම් කිරීමේ ගිවිසුම (1996)** රටවල් තවදුරටත් න්‍යෂ්ටික අවි අත්හද බැලීම හෝ පිපිරවීම් සිදුකිරීම වලක්වාලයි.

## 10. සමාජයීය සහ ආර්ථික සංවර්ධනය එක්සත් ජාතීන්ගේ එක් පරමාර්ථයකි. මින් කුමක් අදහස් වේද?

සිය ජනතාව සම්පූර්ණයෙන්ම රැක බලා ගැනීමට සහ බාහිර උදව් නැතිව ඔවුන්ගේ ජීවන තත්වය නැංවීමට නොහැකි දුප්පත් රටවල් බොහෝය. දිළිඳුකම අඩු කිරීම, සාගින්න පිටු දැකීම සහ සෞඛ්‍යය හා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා වන ලෝක ව්‍යාප්ත සමාජයීය සහ ආර්ථික සංවර්ධන ව්‍යාපාරයකට එක්සත් ජාතීන් නායකත්වය දෙයි. එක්සත් ජාතීන් සිය සම්පත්වලින් සියයට 80 ක් වැය කරන්නේ මේ අරමුණ ජය ගැනීම උදෙසාය. ඒ පිළිබඳ නිදසුන් කිහිපයකි මේ :

- ✳ එක්සත් ජාතීන්ගේ පද්ධතිය සමස්තයක් වශයෙන්, සංවර්ධනය වන රටවල ආර්ථික හා සාමාජයීය වැඩ සටහන්වලට ආධාර පිණිස අවුරුදු පතා ඩොලර් බිලියන 30 (කෝටි 3000) කට වැඩි මුදලක් සපය යි.
- ✳ දස ලක්ෂ සංඛ්‍යාත සරණාගතයනට හා අවතැන්වූවනට ආහාර, ඉදුම් හිටුම් සහ හදිසි වෛද්‍ය ආධාර සපය යි.
- ✳ ළමයිනට ප්‍රතිශක්තිකරණ එන්නත් දී සෑම වසරකම 30 ලක්ෂයකට අධික ළමයි අකාල මරණයෙන් බේරා ගනී.
- ✳ ඒඩ්ස් වසංගතය පිටු දැකීම සඳහා ලොව පුරා සටන් වදී.
- ✳ මත් ද්‍රව්‍ය සැපයුම හා ඉල්ලුම පාලනය කිරීම සඳහා නවතම ක්‍රම සොයා ගැනීමට රටවලට උදව් වෙයි.

### 11. අපේ පරිසරය රැක ගැනීමට එක්සත් ජාතීන් කුමක් කරන්නේ ද? එක්සත් ජාතීන් පරිසරය ගැනත් සැලකිලිමත් වෙනවා ද?

අපේ පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කොටගත් අන්තර් ජාතික ක්‍රියාකාරිත්වය හැඩ ගැස්වීමේලා එක්සත් ජාතීන් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරයි. එය පරිසරය පිළිබඳව පර්යේෂණ කරයි. පාරිසරික තත්වය නිරීක්ෂණය කරයි. ස්වකීය ස්වාභාවික සම්පත් රැකගන්නා ආකාරය ගැන ආණ්ඩුවලට උපදෙස් දෙයි. වඩාත්ම වැදගත් දෙය ජාතික දේශසීමා ඉක්මවා ව්‍යාප්ත වී ඇති විශේෂ පාරිසරික ගැටළු විසඳීම පිණිස අන්තර් ජාතික නීති සම්පාදනය සඳහා විවිධ රටවල ආණ්ඩු එකරාශි කිරීමයි. නිදසුන් කිහිපයක් :

*කාම්බෝජයේ, සියෝපොන්හි අවතැන්වූවන්ගේ කඳවුරක වෙසෙන ගැහැණු ළමයි දෙදෙනෙක් සිය නිවෙස් වෙත දිය ගෙන යති.*



- ❖ **උපද්‍රව පත් ජීවින් වර්ග අන්තර් ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතිය**

(1973) වන සත්ව නිෂ්පාදන වෙළෙඳාම පාලනය කිරීමට ඉවහල් වෙයි.

❖ **මොන්ට්‍රියල් සම්මුතිය** (1987) ඕසෝන් ස්ථරයට හානිකර රසායනික ද්‍රව්‍ය වායුගෝලයට මුදා හැරීම අඩු කරන ලෙස ආණ්ඩු වලට නියම කරයි.

❖ හානිකර අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ **බේසල් සම්මුතිය** (1989) විෂ අපද්‍රව්‍ය අලෙවිය හෝ හානිකර ලෙස ඉවතලීම වලක්වාලයි.

පාරිසරික ගැටළු සාකච්ඡා කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ මෙහෙයීමෙන් 1992 දී බ්‍රසීලයේ රියෝඩි ජැනයිරෝ නුවර ලෝක නායකයන්ගේ රැස්වීමක් පැවැත්විණ. එය **මිහිකත සමුළුව** නමින් පතලය. රට එක්වූ සියයකට අධික නායකයෝ අපේ පරිසරය රැක ගැනීම සහ තුලිත සංවර්ධනය සහතික කිරීම සඳහා වන **න්‍යාය පත්‍රය 21** නම් වූ පරිපූර්ණ වැඩ සැලැස්මක් සම්මත කළහ.

## 12. එක්සත් ජාතීන් මානව අයිතිවාසිකම් ගැන බොහෝ සේ කථා කරයි. ඉන් කුමක් අදහස් වේද?

මානව අයිතිවාසිකම් යනු අපට මනුෂ්‍යයන් වශයෙන් ජීවත්වීම සඳහා අත්‍යාවශ්‍යයෙන්ම තිබිය යුතු අයිතිවාසිකම් සමූහයකි. ජීවත්වීමට සහ නිදහස භුක්ති විඳීමට ඇති අයිතිය, නීතිය හමුවේ සමානාත්මතාව, කැමැති තැනක විසීමේ නිදහස, වධ හිංසාවෙන් මිදී සිටීමේ නිදහස, සිතීමේ හා ඇදහීමේ නිදහස, වැඩ කිරීමට ඇති අයිතිය සහ අධ්‍යාපනයට ඇති අයිතිය මේ අයිතිවාසිකම් අතර වෙයි. මානව අයිතිවාසිකම් නැතිව අපට පූර්ණ සංවර්ධනයක් අත්කර ගැනීමට සහ අපේ මානව ගුණාංග, අපේ බුද්ධිය, අපේ කුසලතා සහ අපේ ආධ්‍යාත්මික ශක්තිය නිසිලෙස ප්‍රයෝජනයට ගැනීමට නොපිළිවන.

එක්සත් ජාතීන් 1948 දී සම්මත කළ **මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන්** සියලු ජාතීන් උදෙසා පොදු මානව හිමිකම් ප්‍රමිතියක් නියම කළේ ය. මේ ප්‍රකාශනය මගින් ලෝකයේ ආණ්ඩු

**තතු විමසුම :**
**ජලය, ජලය...**

*ජලය කෙතරම් මූලික අවශ්‍යතාවක්ද යත් එය බොහෝ විට ජීවයේ ප්‍රභවය ලෙස හඳුන්වනු ලැබේ. දූෂණය වූ විට ජලය අන්තරාදායක වී භයානක ලෙඩ රෝග ඇති කරයි. බොහෝ රටවල ජනතාවට පානීය ජලය ලබා ගැනීමට ඇති පහසුකම් සීමිතය. මේ නිසා සංවර්ධනය වන රටවල ළමයි අවම වශයෙන් 40 ලක්ෂයක් ජලාශ්‍රිත රෝගාබාධවලින් සෑම වසරකම මරණයට පත්වෙති. වසර 2000 වනවිට සෑම කෙනකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම අරමුණු කොටගත් අන්තර් ජාතික ව්‍යාපාරයක් එක්සත් ජාතීන් විසින් 1980 දී ආරම්භ කෙරිණ. එය දැනටමත් ලොවපුරා බිලියන 1.3 ක් ජනතාවට පිරිසිදු පානීය ජලය සපයා දීමට සමත්ව ඇත. තවත් බිලියන 1.9 ක පිරිසකට සනීපාරක්ෂක පහසුකම් සපයා තිබේ.*

**තතු විමසුම :**
**මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධයක්.**

*දකුණු අප්‍රිකාවේ සුදු ජනයා විසින් භාවිත අෆ්රිකාන්ස් භාෂාව අනුව ආපාතේඩ් (වර්ණභේදවාදය) යන පදයේ තේරුම වෙන්කොට තැබීමයි. දකුණු අප්‍රිකාවේ ජනයාගෙන් සියයට අසූවක් කළු මිනිසුන් වුවද දිගුකල් එරට පාලනය කරන ලද්දේ සුදු සුළුතරය විසිනි. වර්ණභේද ප්‍රතිපත්තිය අනුගමය කළ ඔවුහු රට වර්ගවාදී ලෙස බෙදා වෙන්කොට ඉතා මූලික මානව අයිතිවාසිකම් පවා කළු ජනයාට අහිමි කළහ. වර්ණභේද වාදය "මිනිස් වර්ගයාට එරෙහි අපරාධයක් ලෙස හෙළාදුටු එක්සත් ජාතීන් දශක තුනකට වැඩි කාලයක් මේ පිළිවෙතට එරෙහිව අඛණ්ඩ ව්‍යාපාරයක් ගෙන ගියේ ය. එක්සත් ජාතීන්ගේ සහය සහ අධීක්ෂණය ඇතිව එරට පැවැති ප්‍රථම නිදහස් හා බහුවාර්ගික මැතිවරණයෙන් පසු 1994 අප්‍රේල් මාසයේ දී වර්ණභේද වාදය අවසන් විය. වර්ණභේදවාදයේ නායකයන් විසින් වසර ගණනාවක් තිස්සේ සිරගත කරනු ලැබ සිටි නෙල්සන් මැන්ඩෙලා වාර්ගික ඒකාබද්ධතාවෙන් යුත් නව දකුණු අප්‍රිකාවක ප්‍රථම ජනාධිපතිවරයා ලෙස පත් වූයේ ය.*

ධනවත්, දුප්පත්, ප්‍රබල හා දුබල, ස්ත්‍රී, පුරුෂ, සියලු ජාතීන්ට හා සියලු ආගම්වලට අයත් සියලු මනුෂ්‍යයන්ට සමානව සැලකීම සහතික කිරීමෙහිලා තමන්වෙත පැවරී ඇති වගකීම පිළිගත්තේ ය.

තම වැසියනට සමාජයීය ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් සහතික කරන ලෙස ජාතීනට බල කෙරෙන තවත් අන්තර් ජාතික මානව හිමිකම් සම්මුති ගණනාවක් එක්සත් ජාතීන් විසින් සම්මත කොට ඇත. මේ අතරින් වඩාත් වැදගත් වන්නේ අන්තර් ජාතික සම්මුති දෙකකි. ඉන් එකක් ආර්ථික සාමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳව ද, අනෙක සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව ද වෙයි. වෛකල්පික සන්ධාන දෙක ඇතුළුව මේ සම්මුති එක්වූ විට **අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත** යනුවෙන් හැඳින්වෙයි. එක්සත් ජාතීන් කාන්තාවන්ගේ, ළමයින්ගේ, ආබාධිත පුද්ගලයින්ගේ, සුළුජන කණ්ඩායම් වල ආදිවාසී ජනයාගේ සහ වෙනත් අවදානම් පත් කණ්ඩායම්වල අයිතිවාසිකම් පිළිගන්නා සම්මුතීන් ගණනාවක් සම්පාදනය කර ඇත. එබඳු එක් සම්මුතියක් වන **ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය** දැන් රටවල් 185 කට වැඩි ගණනක් විසින් පිළිගෙන තිබේ.

දකුණු අප්‍රිකාවේ ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය අමතයි.



**13. මානව අයිතිවාසිකම් ආරක්ෂා කැරෙන නීති තිබුණාද මානව හිමිකම් උල්ලංඝනය කිරීම් බොහෝ සිදුවෙයි. ඒවා පිළිබඳව එක්සත් ජාතීන් කරන්නේ කුමක් ද?**

නීතියට ගරු කිරීම සහතික කරනු වස් එක්සත් ජාතීන් විවිධ ක්‍රම අනුගමනය කරයි. එය ජාතීන්ගේ මානව අයිතිවාසිකම් වාර්තා නිරීක්ෂණය පිණිස සම්මුති මණ්ඩල පිහිටුවා ඇත. විශේෂ ක්‍රියාකාරී කණ්ඩායම්



එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවේ භටයෙක් සමග ළමයෙක්.

එකිනෙක රටේ මානව හිමිකම් වාර්තා විභාගකර බලති. කිසියම් රටකට විශේෂ නියෝජිතයන් යවා මානව හිමිකම් උල්ලංඝණය කර ඇති බවට ලැබී ඇති ඕනෑම වාර්තාවක් අධ්‍යයනය කිරීම තවත් ක්‍රමයකි. ආණ්ඩු විසින් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව ජනතාවගෙන් ලැබෙන පැමිණිලි පරීක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන් ඇතැම් රටවල විශේෂ කොමිෂන් සභා ස්ථාපනයට පවා උදව්කොට තිබේ. මානව අයිතිවාසිකම් ගැටළු සාකච්ඡා කිරීමට අන්තර් ජාතික සමුළු පවත්වන එක්සත් ජාතීන් මානව හිමිකම් ප්‍රශ්න සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නැයි ආණ්ඩුවලින් ඉල්ලා සිටී.

### 14. වෙනත් කවරාකාර අන්තර්ජාතික නීති සම්පාදනයට එක්සත් ජාතීන් උදව්කොට තිබේ ද?

නූතන ප්‍රවාහනය හා සන්නිවේදනය ලෝකයේ රටවල් එකිනෙකට වඩාත් සමීප කර ඇති හෙයින් එකී රටවලට සහයෝගයෙන් ක්‍රියා කරනුවස් තව තවත් අන්තර්ජාතික නීති අවශ්‍ය වෙයි. සැබවින්ම මිනිස් ඉතිහාසයේ පෙර කවර කලෙකවත් නොලියැවුණු තරම් අන්තර් ජාතික නීති සමුදයක් එනම් 350 කට වැඩි ගණනක් - ලෝකයේ රටවල් විසින් ගතවූ 50 වසර ඇතුලත එක්සත් ජාතීන් මගින් සම්පාදනය කර ඇත. මුහුදු පරිහරණයේ සිට විෂ මත්ද්‍රව්‍ය පාලනය දක්වාත්, ගුවන් සේවාවන් හි ආරක්ෂාවේ සිට තැපැල් ලිපි බෙදීම දක්වාත් අභ්‍යවකාශයේ සිට පරිසරය දක්වාත් පුළුල් පරාසයක් ආවරණය කරන මේ නීති අන්තර් ජාතික සහයෝගිතාවට අවශ්‍ය පදනම නිර්මාණය කොට ඇත.

### 15. එක්සත් ජාතීන් සාමය හා ප්‍රගතිය උදෙසා වෙහෙසෙයි. එහෙත් අද ලෝකයේ සාමය ඇත්තේ ඉතා අඩුවෙනි. තමන්ගේම තීරණ ක්‍රියාත්මක කිරීමට අසමත් සංවිධානයක් අපට අවශ්‍ය ඇයි?

ගතවූ 50 වසර ඇතුළත ලෝකයේ යුද්ධ 150 පමණ හටගත් නමුදු එක්සත් ජාතීනට ස්තුති වන්නට ඒවා විනාශකාරී ලෝක යුද්ධ බවට වර්ධනය වූයේ නැත. පරිමාණයෙන් කුඩා යුද්ධ නතර කිරීමට සහ ස්වකීය තීරණ මුළුමනින් ක්‍රියාත්මක කරවීමට හැකිවන පරිදි එක්සත් ජාතීන් වඩාත් ශක්තිමත් කළයුතු යැයි බොහෝ දෙනා අදහස් කරති. එහෙත් එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරිත්වයෙහි ඵලදායක බව රැඳී ඇත්තේ සාමාජික රටවල දේශපාලන අභිලාෂය මතය. තමන්ගේම තීරණවලට ගරු කිරීමට ඔවුන් තුළ ඇති සූදානම ඉන් අදහස් වෙයි. එසේම මේ ක්‍රියාකාරකම් බෙහෝ වියදම් සහිතය. අරමුදල් හිඟය හේතුවෙන් වඩා ඵලදායක කාර්ය භාරයක් ඉටු කිරීමට එක්සත් ජාතීනට බොහෝ විට නොහැකි වෙයි.

එක්සත් ජාතීන්ගේ ශක්තිය, ප්‍රභවය ලබන්නේ ඉතාමත් කටුක අභියෝගය හමුවේ පවා පරාජය භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම තුලිනි.

යුධ වැදී සිටින රටවලට එය නතර කිරීමට අභිලාෂයක් නැතිකල සිය සාම සාධක හමුදා ඉවත් කර ගැනීමට එක්සත් ජාතීනට ඇතැම් විට සිදුවෙයි. එහෙත් එය අදාල පාර්ශවයන් සමග නිරතුරුව අදහස් හුවමාරු කර ගනිමින් රාජ්‍ය තාන්ත්‍රික ක්‍රම සහ සාකච්ඡා මගින් සිය මෙහෙවර අඛණ්ඩව පවත්වා ගනී. තත්වය වඩා යහපත් වූ විට සාම සාධක හමුදා අදාල රට වෙත ආපසු යාමට ඉඩ ඇත.

සියලු දෙනාට සාමය හා සාධාරණත්වය සහතික කිරීමට ලෝකය තව බොහෝ දුර යා යුතුය. යුද්ධ, දරිද්‍රතාව සහ මානව හිමිකම් කඩ කිරීම් තවමත් පුළුල්ව පැතිර පවතී. එක්සත් ජාතීන් සිය මෙහෙවර ඉදිරියටම ගෙන යා යුත්තේ මේ හේතුව නිසාමය. එහි කාර්ය භාරය තවමත් අවසන් වී නැත. එක්සත් ජාතීන්ගේ පැවැත්ම නතර වන්නේ නම් එක්සත් ජාතීන් අද කරන දෙයම කිරීම සඳහා වෙනත් නමකින් හෝ තවත් සංවිධානයක් බිහි කිරීමට ලෝකයේ රටවලට සිදුවනු ඇත.

**තතු විමසුම : *ගැහැණු දරුවනට පාසැල්***

ලොකයේ සෑම තැනකම ගැහැණු ළමයි වෙනස්කම්වලට මුහුණ දෙති. බොහෝ විට ඔවුනට ආහාර ලැබෙන්නේ පිරිමි දරුවනට අඩුවෙනි. බොහෝ රටවල අවුරුදු 5 හෝ 6 වයසේදී පවා දීර්ඝ වේලාවක් වැඩ කිරීමට ඔවුනට සිදුව ඇත. අවුරුදු 6-11 අතර ගැහැණු ළමයි මිලියන 80 ක් පාසැල් නොයති. එක්සත් ජාතීන් සම්මත කොටගත් ළමා

අයිතිවාසිකම් ප්‍රඥප්තිය ගැහැණු දරුවනට උගැන්වීම සඳහා වැඩිපුර මුදල් වැය කරන ලෙස ආණ්ඩුවලින් ඉල්ලා සිටී. අර්ධ වශයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රයත්නය නිසා වර්තමානයේ ප්‍රාථමික පාසල් වයසේ ළමයින්ගෙන් සීයයට 77ක් පාසල් වලට ඇතුලත් කර ගැනෙති. 1960 දී මේ සංඛ්‍යාව ට සීයයට 50 ට අඩු විය. මෙය ප්‍රගතියකි. එහෙත් තව බොහෝ දේ කළ යුතුව තිබේ.

**තතු විමසුම :** ***සරණාගතයන්ට සරණ වීම.***

1995 දී මිලියන 53 කට අධික ජනයා - පෘථිවිය මත මිනිසුන් 115 කට එක් අයෙක් - සරණාගතයන් ලෙස හෝ අභ්‍යන්තරිකව අවතැන් වුවන් ලෙස හෝ සලකනු ලැබූහ. සිය මව්බිම අත්හැර පලාගොස් විදේශයක සරණාගතයන් බවට හෝ සිය ගෙදෙර අත්හැර තමන්ගේම රටේ වෙනත් ප්‍රදේශයකට පලායෑමට හෝ යුද්ධය, දේශපාලන අවුල් වියවුල්, සිවිල් කෝලාහල සහ ජනවාර්ගික වෛරය විසින් ඔවුනට බල කෙරිණ. ඔවුන්ගෙන් බහුතරය ළමයි සහ ස්ත්‍රීහු වෙති. ඔවුන් කවරකුට වත් නිවහනයැයි කිවහැකි ස්ථානයක් නැත. ඔවුන්ගෙන් බොහෝ දෙනකුට අවසාන පිහිට එක්සත් ජාතීන් ය. එක්සත් ජාතීන් සරණාගතයනට අවශ්‍ය ආහාර හදිසි වෛද්‍ය සේවා සහ සුරක්ෂිත ඉදුම් හිටුම් සපයා දෙයි. ඇතැම්විට සරණාගතයන් උදෙසා පාසල් සහ වෘත්තීය පුහුණු ආයතන ආරම්භ කැරෙයි .

*සරණාගත කඳවුරක ඉගෙන ගන්නා සිසුන් පිරිසක්*



**තතු විමසුම : විපතකට මුහුණ දීම**

පන් ලක්ෂයකට අධික ජනයාට මරු කැඳවමින් සහ තුවාල සිදු කරමින් 1990 නොවැම්බර් මාසයේ දී බංගලිදේශය හරහා චණ්ඩ කුණාටුවක් හමා ගියේය. ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ නිවෙස් විනාශයට පත්විය. විපතට පත් ප්‍රදේශය වෙත ප්‍රථමයෙන් හදිසි සහනාධාර පැමිණියේ එක්සත් ජාතීන් වෙතිනි. ඖෂධ, ටින්වල අසුරණ ලද ආහාර, කම්බිලි සහ කූඩාරම් ඊට අයත් විය. සහන සේවා සැලසීම සඳහා කඳවුරු ඉදි කෙරිණ. පසුව එක්සත් ජාතීන් සහනාධාර සපයන්නැයි ලෝක ව්‍යාප්ත ආයාචනයක් කළේ ය. එක්සත් ජාතීන්ගේ සහාය ඇතිව වැඩ කරමින් බංගලිදේශ ජනතාව කෙමෙන් කෙමෙන් සිය ගේ දොර නැවත තනා ගත්හ.

භූමි කම්පා, කුණාටු, ගංවතුර බඳු ස්වාභාවික විපත් කවර තැනක හෝ කවර වේලාවක හෝ සිදුවිය හැකි ය. එවැනි ආපදාවකට මුහුණ දෙන ඕනෑම රටකට හැකි ඉක්මනින් උපරිම හදිසි සහනාධාර සැපයීමේ අන්තර් ජාතික ප්‍රයත්නය සම්බන්ධීකරණය එක්සත් ජාතීන්ගේ ප්‍රමුඛ කාර්යයකි. ස්වාභාවික විපත් නිසා උද්ගතවන තර්ජන පිළිබඳව ලෝකය වඩා දැනුවත් කරනු පිණිස එක්සත් ජාතීන් 1990 දශකය ස්වාභාවික විපත් අඩු කිරීමේ අන්තර් ජාතික දශකය ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

**තතු විමසුම : වසූරිය මිහිතලයෙන් පිසදැමේ**

සරම්ප, ක්ෂය රෝගය, පිටගැස්ම, ගලපටලය, කක්කල් කැස්ස සහ පක්ෂ ගාතය බොහෝ සංවර්ධනය වන රටවල දරුවන් බිලිගන්නා වඩාත්ම මාරාන්තික රෝග හයකි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ව්‍යායාමය නිසා ලෝකයේ ළමා පරපුරෙන් සියයට අසූවකට ප්‍රතිශක්තිකරණය ලබාදී සෑම වසරකම ළමා ජීවිත තිස් ලක්ෂයක් රැකගැනීමට හැකිවී ඇත. තවත් මාරාන්තික රෝගයක් වන වසූරිය දැන් මිහිතලයෙන් අතුගා තිබේ. පක්ෂාගාතය බටහිර අර්ධ ගෝලයෙන් අතුගා දමා ඇත.

*වෛද්‍ය සහායකයෙක් රෝහලකදී ළමයිනට එන්නත් ලබාදෙයි.*





**තතු විමසුම : *වහල් යදම් බිඳෙයි***

1945 වනවිට ලෝක ජනගහනයෙන් අඩක්ම ජීවත් වුයේ පිටස්තරයන් විසින් පාලනය කරන ලද රටවල ය. යටත් විජිත නමින් හැඳින්වුණු මේ රටවල් මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය සහ පෘතුගාලය වැනි බලවතුන් අතලොස්සක් විසින් තමන් අතර බෙදාගෙන තිබිණ. එක්සත් ජාතීන් නිර්යටත්විජිත කරණය නම් වු ක්‍රියාදාමය ඔස්සේ යටත් විජිත බොහොමයකට ස්වාධීනත්වය අත්කර ගැනීමට උදව් කළේ ය. පැරණි යටත් විජිත ජාතීහු 80 කට වැඩි ගණනක් දැන් එක්සත් ජාතීන්ගේ සාමාජිකයෝ වී සිටිති. අද පරාධීන ප්‍රදේශවල වෙසෙන ජනගහනය 15 ලක්ෂයක් පමණි.

සයරේභි (වර්තමාන කොන්ගෝවේ) මියෝකෝමා නගරයේ දි අවු12 වයසැති උවම්බජි මාතා දැරියට සිය මව හමුවු අවස්ථාව.

**තතු විමසුම : *නුබියා දෙවොල රැකගැනීම***

ඊජිප්තුව නුබියා, දෙවොල ඇතුළු ඉපැරණි පුජ්‍ය ස්ථාන හා ස්මාරක රැසක් ඇති රටකි. නයිල් ගංගාව හරහා අස්වාන් වේල්ල ඉදි කිරීම වසර 5000 පැරණි මේ ස්මාරකවල පැවැත්මට තර්ජනයක් විය. ඒවා විනාශයෙන් බේරා ගැනීම සඳහා යුනෙස්කෝව 1960 දී අන්තර් ජාතික ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. ජලයෙන් යටවන ප්‍රදේශයෙන් ස්මාරක ඉවත්කොට වඩා උස් ස්ථානයක් කරා ගෙන යායුතු විය. එක්සත් ජාතීන් විසින් මෙහෙයවුණු අන්තර් ජාතික විශේෂඥයන් කළේ හරියටම එයයි : ස්මාරක කොටස්වලට වෙන්කළ ඔව්හු වඩා සුරක්ෂිත ස්ථානයකට ගෙනගොස් ඒවා යළි එකලස් කළහ. මේ විස්මය ජනක කාර්යය නිම කිරීමට ඔවුනට 20 වසරක් ගතවිය.

ග්‍රීසියේ ඇතැන්ස් නුවර ඇක්‍රොපොලිස්, කාම්බෝජයේ අංකෝර්වත් විහාරය, ඕස්ට්‍රේලියාවේ උලුරු-කතා ජුතා ජාතික උද්‍යානය, ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියා පුස්තකාලය සහ ඉන්දුනීසියාවේ ජාවාහි බොරෝ බුදුර් විහාරය ඇතුළු රටවල් 80 කට වැඩි ගණනක ඓතිහාසික ස්මාරක ආරක්ෂා කිරීමට යුනෙස්කෝව මේ දක්වා දායක වී ඇත.



නුබියා දෙවොලෙහි කොටසක් ඉවත් කරන අයුරු



එක්සත් ජාතීන්ගේ සාම
සාධක හමුදා මෙහෙවර
සඳහා පිරිනැමුණු
නොබෙල් සාම ත්‍යාග
ලාංඡනය

**තතු විමසුම : ඝාතක භූමි**

බිම් බෝම්බ, පොළොව යට සඟවා ඇති මාරාන්තික පුපුරණ ද්‍රව්‍ය විශේෂයකි. ලෝකයේ රටවල් 68 කට වැඩි ගණනක ඒවා වළදමා තිබේ. සෑම මසකම බිම් බෝම්බවලට ගොදුරු වීමෙන් මරුට බිලිවන හෝ තුවාල ලබන පිරිස 2000 කට අධිකය. කාම්බෝජයේ පමණක් මිලියන 6 සිට 10 දක්වා වූ බිම් බෝම්බ සංඛ්‍යාවක් සැඟවී සිටිමින් දිනකට 10 දෙනෙකු ගොදුරු කරගනී. එක්සත් ජාතීන් මේ බියකරු ශාපය පිටු දැකීමට ලෝකයේ රටවලට සහාය වෙයි.

බිම් බෝම්බ ඉවත් කිරීම බොහෝ කල්ගතවන සහ වියදම් අධික ව්‍යායාමයකි. සෑම වර්ග මීටරයක්ම සලකුණු කොට සැලකිල්ලෙන් අධ්‍යයනය කළ යුතුය. දැනට ලොවපුරා වළදමා ඇතැයි ගණන් බලා තිබෙන මිලියන 110 ක් වන බිම් බෝම්බ ඉවත් කිරීමට ආසන්න වශයෙන් ඩොලර් බිලියන 33 ක මුදල් සහ වසර 1100 ක කාලයක් අවශ්‍ය වෙයි. බිම් බෝම්බ නිෂ්පාදනය අලෙවිය හා භාවිතය තහනම් කිරීමේ අන්තර් ජාතික ගිවිසුමක් සැකසීමට එක්සත් ජාතීන් ප්‍රමුඛ මෙහෙවරක් ඉටු කර ඇත.

**තතු විමසුම : සාමය සුරැකීම වෙනුවෙන් ත්‍යාගයක්**

**"බොහෝ සෙයින් එකිනෙකට වෙනස් පසුබිම් සහිත ඔවුන් පැමිණියේ විවිධ රටවලිනි. එහෙත් ඔව්හු එක් දෙයක් අරභයා එක්සත්ව සිටියහ. අවදානම දැන දැනම සේවය සඳහා තම තාරුණ්‍ය හා තම ශක්තිය කැප කිරීමට ඔව්හු සූදානමින් සිටියහ. මනුෂ්‍යයකුට කළහැකි උසස්ම පරිත්‍යාගය කිරීම ඔවුන්ගේ පරමාර්ථය විය."**

නෝර්වීජියානු නොබෙල් කමිටුව එක්සත් ජාතීන්ගේ සාම සාධක බලකායට 1988 සාම ත්‍යාගය ප්‍රදානය කළේ මේ පැසසුම් වදන් සමගිනි. එක්සත් ජාතීනට හෝ එක්සත් ජාතීන්ගේ ආයතනයකට හෝ නොබෙල් සාම ත්‍යාගය ප්‍රදානය කෙරුණු හයවැනි අවස්ථාව එයයි. එක්සත් ජාතීන්ගේ සාම හමුදාවල නිල් හිස්වැසුම පැළඳ ගත් සෙබළු 17 දෙනෙක් එක්සත් ජාතීන්ගේ සෙසු දහස් සංඛ්‍යාත සාම හමුදා භටයන් වෙනුවෙන් සම්මානය භාර ගත්හ.

1996 දෙසැම්බර් වනවිට සෙබළු 720,000 කට වැඩි පිරිසක් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් 42 ක සේවය කර තිබිණ. 1458 දෙනෙක් සිය ජීවිත පූජා කළහ.

# 4

# නිතර අසනු ලබන ප්‍රශ්න සමහරක්...

## 1. එක්සත් ජාතීන්ගේ සාමාජිකයකු විය හැක්කේ කාටද?

එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලැබිය හැක්කේ අන්තර් ජාතික පිළිගැනීමක් සහිත ස්වාධීන රටවලට පමණි. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව, සිය වගකීම් පිළිගන්නා සහ එකී වගකීම් ඉටු කිරීමට හැකි සහ කැමැති සියලු සාම ලැදි රාජ්‍යයනට සංවිධානය විවෘතය. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහා මණ්ඩලයේ තීරණය පරිදි නව රාජ්‍යයනට එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය පිරිනැමේ.

## 2. "නිශේධ බලය" යනු කුමක් ද?

ලෝකයේ ප්‍රධාන බලවත්හු 5 දෙනෙක් එක්සත් ජාතීන් බිහි කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළහ. දෙවැනි ලෝක යුද්ධයෙන් ජයග්‍රහණය කළ ප්‍රධාන බලවත්හු ද ඔවුහුම වූහ. මේ මහ බලවතුන් 5 දෙනා චීනය, ප්‍රංශය, රුසියානු ෆෙඩරේෂණය, (කලින් සෝවියට් දේශය), එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය - අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමෙහිලා දිගටම වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්පාදනය කළ අය කල්පනා කළහ. සාමය තහවුරු කිරීමට හොඳම මඟ වූයේ විශේෂයෙන් යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්නවලදී පොදු එකඟත්වයක් ඇතිව එක්ව වැඩ කිරීමට මේ බලවතුන් 5 දෙනා යොමු කිරීමයි. මෙසේ, පරිපාටිමය නොවන කරුණක් අරභයා **මහ 5 දෙනාගෙන්** "එක් අයකු" නිශේධනීය ඡන්දයක්" දුනහොත් යෝජනාවක් සම්මත කොට ගැනීමට ආරක්ෂක මණ්ඩලයට නුපුලුවන් බවට එකඟත්වයක් ඇතිකර ගන්නා ලදී. ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සාමාජිකයනට පිරිනැමුණු මේ විශේෂ බලය **"නිශේධ බලය"** නමින් ප්‍රකට විය.

න්‍යාය පත්‍රය අනුමත කිරීම, මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි වන ලෙස සාමාජික රාජ්‍යයයනට ඇරැයුම් කිරීම හෝ පරිපාටිමය රීති අනුමත කිරීම හෝ වැනි **පරිපාටිමය කරුණු** සම්බන්ධයෙන් තීරණ ගනු ලබන්නේ ආරක්ෂක මණ්ඩලය සාමාජිකයන් 15 දෙනාගෙන් කවර හෝ 9 දෙනකුගේ "ඔව්" ඡන්දයෙනි. මෙහිදී ස්ථාවර සාමාජිකයනට නිශේධ බලය භාවිත කිරීමට අයිතිය නැත.

## 3. මහ බලවතුන් 5 දෙනකුට පමණක් නිශේධ බලය තිබීම සාධාරණ ද?

ආරක්ෂක මණ්ඩලය ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීමේ අවශ්‍යතාව බොහෝ ජාතීහු මෑතක සිට පෙන්වා දෙති. එසේ වුවද එය කළයුත්තේ කෙසේදැයි තවම එකගත්වයකට පැමිණ නැත. ඇතැම් සාමාජික රටවල් නිශේධ බලය අහෝසි කිරීමේ අදහසට විරුද්ධය. ලෝක සාමය තර්ජනයට ලක්වන ඇතැම් අවස්ථාවලට මේ අයිතිය සීමා කිරීමට තවත් අය කැමැත්ත පල කරති. කුමන වෙනසක් වුවද සිදු කිරීමට පෙර එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කළයුතු වෙයි.

මහා මණ්ඩලය විසින් ස්ථාපිත ක්‍රියාකාරී කණ්ඩායමක් ආරක්ෂක මණ්ඩල සාමාජිකත්වය පුළුල් කිරීමේ යෝජනා 1994 ජනවාරියේ සිට සලකා බලමින් සිටී. වත්මන් දේශපාලන හා ආර්ථික යථාර්ථයන් පිළිබිඹු වන පරිදි අප්‍රිකාවෙන් එක් රටක් ආසියාවෙන් එක් රටක් සහ ලතින් අමෙරිකාවෙන් තවත් රටක් නව ස්ථාවර සාමාජිකයන් අතරට තෝරාගත යුතුයැයි සමහර රාජ්‍යයන් යෝජනා කර ඇත. මේ යෝජනා ගැනද තවම එකගත්වයකට පැමිණ නැත.

## 4. එක්සත් ජාතීන්ගේ දිනය කවද ද?

සරල පිළිතුර එක්සත් ජාතීන්ගේ උපන් දිනය යන්නයි. ආරම්භක සාමාජිකයන්ගෙන් බහුතරය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට එකග වෙමින් සිය සාමාජිකත්වය නිල වශයෙන් පිළිගත් 1945 ඔක්තෝබර් 24 වැනි ද එක්සත් ජාතීන් උපත ලැබී ය. ඒ අනුව ඔක්තෝබර් 24 වැනි ද එක්සත් ජාතීන්ගේ දිනය ලෙස ලොවපුරා සමරනු ලැබේ.

## 5. එක්සත් ජාතීන්ගේ අනෙක් වැදගත් සැමරුම් දින සමහරක් කවරේ ද?

සෑම වසරකම සැප්තැම්බර් මස තුන්වැනි අඟහරුවාද අන්තර්ජාතික සාම දිනය ලෙස නම් කර ඇත. මේ සැමරුම් දිනය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ වාර්ෂික නිත්‍ය සැසිවාරය ආරම්භ කරන දිනය සමග සමපාත වෙයි.

**එක්සත් ජාතීන්ගේ සෙසු සැමරුම් දින කිහිපයක් පහත දැක්වෙයි.**

❖ අන්තර් ජාතික කාන්තා දිනය (මාර්තු 08)

- ❖ ලෝක පරිසර දිනය (ජුනි 05)
- ❖ දිළිඳුකම පිටු දැකීමේ අන්තර් ජාතික දිනය (ඔක්. 17)
- ❖ ලෝක එඩ්ස් දිනය (දෙසැම්බර් 01)
- ❖ මානව අයිතිවාසිකම් දිනය (දෙසැම්බර් 10)

## 6. එක්සත් ජාතීනට නිල ගීයක් තිබේ ද?

එක්සත් ජතීන්ට නිල ගීයක් හෝ ස්තෝත්‍රයක් හෝ නැත. නිල ගීයක අවශ්‍යතාව පිළිගන්නා මහා මණ්ඩලය සුදුසු ගීතයක් තෝරා අනුමත කිරීමේ අයිතිය තමන් වෙත තබාගෙන සිටී. මේ දක්වා අවසන් තීරණයක් ගෙන නැත.

එක්සත් ජාතීනට උපහාර පිණිස ඉංග්‍රීසි ජාතික ඩබ්.එච්. අවුඩන් කවියා විසින් රචිත ස්තෝත්‍රයකට ස්පාඤ්ඤයේ විශාරද පැබ්ලෝ කැසල්ස් 1970 දී සංගීතය නිර්මාණය කළේ ය. මේ ස්තෝත්‍රය 1971 එක්සත් ජාතීන්ගේ දින එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දී වාදනය කෙරිණ.

එක්සත් ජාතීන්ගේ දින සැමරීමට කළ හැක්කේ කුමක් ද ?

එක්සත් ජාතීන්ගේ දින සමරනුවස් කළ හැකි දේ බොහෝය .මේ කිහිපයකි:

එක්සත් ජාතීන්ගේ දිනය සාමය හා ජාතීන් අතර මිත්‍රත්වය සිහිපත් කිරීමට කදිම අවස්ථාවෙකි. මේ ලෝකය වඩා යහපත් තැනක් බවට පත් කිරීමෙහිලා දිගටම මුහුණ පෑමට සිදුවන අභියෝග ගැන කල්පනා කිරීමට ද එය අවස්ථාවක් වෙයි. අප සියලු දෙනාටම මේ සම්බන්ධයෙන් වගකීමක් ඇති හෙයින් එක්සත් ජාතීන්ගේ දින සැමරුමට සෑම අයෙක්ම හවුල විය යුත්තේ ය.

**පාසලේදී :** පාසලේ හෝ පන්ති කාමරයේ හෝ රැස්වීමක් සංවිධාන කොට එක්සත් ජාතීන්ගේ දිනය සැමරීමට ඔබට පිළිවන. ඔබේ පාසලේ විවිධ රටවලට අයත් සිසුන් සිටිනම් ඔවුනට තම ජාතික ඇඳුම් වලින් සැරසී ජාතික ගී ගායනා කොට තම මව් රටවල කතාන්තර උනුන් සමග කීමට හැකි ය.

සාම සාධනය, ධරණීය සංවර්ධනය සහ මානව අයිතිවාසිකම් වැනි විවිධ ක්ෂෙත්‍රවල එක්සත් ජාතීන්ගේ කාර්ය භාරය අරභයා විවාදයක් සංවිධාන කිරීම ඔබට කළහැකි තවත් දෙයකි. තෝරාගත් මාතෘකාව පිළිබඳව දේශනයක් කරන මෙන් ආරාධිත දේශකයකු කැඳවිය හැකි ය. විවිධ රටවල කොඩි පිළියෙල කිරීමට ශිෂ්‍යයනට පිළිවන. විවිධ සංස්කෘතීනට අයත් පොත් ප්‍රදර්ශනයක් පුස්තකාලයේ පැවැත්විය හැකි

ය. ඔබේ පන්ති කාමරයේ බිත්ති සඟරාවේ හෝ පාසල් පුවත්පතේ හෝ විශේෂ මුද්‍රණයක් මගින් එක්සත් ජාතීන්ගේ දිනය අනුස්මරණය කළ හැකි ය.

ඔබට දෘශ්‍ය මාධ්‍ය පහසුකම් තිබේ නම් ප්‍රදේශයේ දෘශ්‍ය පට හලකින් හෝ ළඟම ඇති එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රයෙන් හෝ චිත්‍රපටයක් සපයා ගන්නා ලෙස ඔබේ ගුරුවරයාගෙන් ඉල්ලා සිටීමට පිළිවන. පුවත්පත් වලට ඔබේ නමින් ලිපි ලියමින් එක්සත් ජාතීනට පුළුල් සහයෝගයක් දෙන ලෙස ආයාචනය කිරීම ඔබට කළ හැකි තවත් දෙයකි.

ඔබේ සහයෝගය පල කරනු වස් ඔබ රටේ හෝ ප්‍රදේශයේ එක්සත් ජාතීන්ගේ සංගමයට සම්බන්ධවීම ගැනද සලකා බලන්න. ඔබේ සමාජ අධ්‍යයන පන්තියෙහි ආදර්ශ එක්සත් ජාතීන්ගේ වැඩ සටහනක් සංවිධාන කිරීමෙන් ද එක්සත් ජාතීන්ගේ දින සමරුවට දායක විය හැකි ය.

**ජන සමාජයේදී** : එක්සත් ජාතීන්ගේ ධජය එසවීමේ උත්සව, සමුළු හා සම්මන්ත්‍රණ, අන්තර් ජාතික සංගීත සංදර්ශන, කලා සහ අත්කම් භාණ්ඩ සල්පිල්, පොත් අලෙවිය සහ ආහාර අලෙවිය එක්සත් ජාතීන්ගේ දින සමරුවට සංවිධාන කෙරෙන සාම්ප්‍රදායික වැඩ සටහන් කිහිපයකි.

සමරුවට සමගාමීව එක්සත් ජාතීන්ගේ දින ප්‍රකාශනයක් නිකුත් කරන ලෙස ඔබේ පළාත් පාලන ආයතනය දිරි ගැන්විය හැකි ය. රාජ්‍ය නොවන සංවිධානවලට සාමය සහ මානව අයිතිවාසිකම් සුරැකීම ප්‍රවර්ධනය සඳහා වැදගත් මෙහෙයක් කළ අය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ දින සම්මානයක් ප්‍රදානය කළ හැකිය.

බොහෝ රටවල එක්සත් ජාතීන්ගේ දිනයට පැල සිටුවීම්, දිළින්දන් සඳහා පොත් සහ රෙදිපිළි එකතු කිරීම සහ අන්තර් ජාතික මානුෂවාදී උපකාර සඳහා අරමුදල් රැස් කිරීම ආදිය සංවිධාන කෙරේ. සමහරවිට ආණ්ඩු මේ දිනය සිහිපත් කරන්නේ වීථියක් හෝ උද්‍යානයක් හෝ එක්සත් ජාතීන් නමින් නම් කිරීමෙන් සහ එක්සත් ජාතීන්ගේ දින සමරු මුද්දර හා කාසි නිකුත් කිරීමෙනි.

සෑම දිනකම ලොවපුරා ජනයාගෙන් එක්සත් ජාතීන් වෙත ලිපි විශාල සංඛ්‍යාවක් ලැබේ. ඉන් බොහොමයක් ලැබෙන්නේ සංවිධානයේ කාර්යභාරයට සිය සහයෝගය පල කරනු වස් තරුණයන් වෙතිනි.

තවත් අය මහ ලේකම්වරයාට සිය කාර්යය වඩා හොඳින් ඉටුකළ හැක්කේ කෙසේදැයි අවවාද දෙති. 1996 ඔක්තෝබර් 24 වැනිදා මහජන තොරතුරු දෙපාර්තමේන්තුව එක්සත් ජාතීන්ගේ දිනය සමරනුවස් මහා මණ්ඩල ශාලාවේදී විශේෂ වැඩ සටහනක් මෙහෙය වීය. තරුණයන් විසින් එවන ලදුව තෝරාගත් ලිපි සමූහයක් එහිදී කියවනු ලැබී ය. එක්සත් ජාතීනට සහයෝගය දක්වන එක්සත් ජනපදයේ වොෂින්ටන් නුවර පාසල් දරුවකු ලියූ මේ ලිපිය ද ඒ අතර විය.

> *ආදරණීය එක්සත් ජාතීන්*
>
> *ලෝකයේ යුද්ධ පිළිබඳව මම ඔබට ලියමි. මිනිසුන් මැරීම වෙනුවට බොක්සිං තරගයක් පැවැත්වීමට ලෝකයේ නායකයන්ට නොහැකි ඇයි ?*
>
> ***හිතවත්,***
> ***කීත් කවුට්ස්,***
> ***තැන්වැනි ශ්‍රේණිය,***
> ***කැපෝසින් ප්‍රාථමික පාසල,***
> ***ග්‍රැහැම්, වොෂින්ටන්***

## 7. එක්සත් ජාතීන් පිළිබඳ වැඩිපුර තොරතුරු ලබා ගැනීම සඳහා මා ලිවිය යුත්තේ කාට ද?

එක්සත් ජාතීන් ලෝකයේ මුල් පෙළේ තොරතුරු සම්පාදකයන් අතරට වැටේ. එය වැදගත් පර්යේෂණ ප්‍රකාශන, සංඛ්‍යාමය වාර්තා, ආර්ථික සමීක්ෂණ සහ සාමාජයීය හා දේශපාලන ගැටළු පිළිබඳ වාර්තා ප්‍රකාශයට පත් කරයි. සංඛ්‍යාලේඛණවල සිට අවි පාලනය දක්වාත් ආර්ථික විද්‍යාවේ සිට පරිසරය දක්වාත්, විද්‍යාවේ සිට අන්තර්ජාතික කටයුතු දක්වාත් සියලු වැදගත් ක්ෂෙත්‍ර එක්සත් ජාතීන්, ඊට අයත් විශේෂිත ආයතන සහ වැඩ සටහන් විසින් ආවරණය කරනු ලැබේ. එය චිත්‍රපට දෘශ්‍යපට සහ ගුවන් විදුලි වැඩ සටහන්ද නිෂ්පාදනය කරයි. එක්සත් ජාතීන් පිළිබඳ වැඩිපුර තොරතුරු සම්පත් සපයා ගැනීමට මේ ලිපිනයට ලියන්න.

Public Inquiries Unit, Department of Public Information, GA-57, United Nations, New York NY 10017 ; Fax : (212) 963-0071 ; E-mail, : Inqurics@ UNORG

## 8. එක්සත් ජාතීන් පිළිබඳ තොරතුරු අන්තර් ජාලය ඔස්සේ ලබාගත හැකි ද?

ඔව්. එක්සත් ජාතීනට තමන්ගෙම වර්ල්ඩ් වයිඩ් වෙබ් (World Wide Web) පිටුවක් (Home page) ඇත. එය තේමාවන් 5ක් යටතේ පිළියෙල කර තිබේ. සාමය හා ආරක්ෂාව, ආර්ථික සහ සාමාජීය සංවර්ධනය, අන්තර් ජාතික නීතිය, මානව අයිතිවාසිකම් සහ මානුෂවාදී කාර්යයන් වශයෙනි. එක්සත් ජාතීන්ගේ විවිධ ආයතන, ප්‍රවෘත්ති, ලේඛණ සහ ශ්‍රව්‍ය/දෘශ්‍ය සේවා ඇතළු මාතෘකා ගණනාවක් යටතේ සවිස්තර තොරතුරු ඉතා ඉක්මනින් ලබා ගැනීමට එමගින් හැකිවේ. ඒ හැර ලොවපුරා එක්සත් ජාතීන්ගේ වෙබ් සයිට් සිතියමක් ඔස්සේ ජිනීවා, පැරිස්, වියානා සහ තෝකියෝ වැනි විවිධ ස්ථානවල පිහිටි එක්සත් ජාතීන්ගේ කාර්යාල හා ආයතන සමග සම්බන්ධ වීමට පිළිවන.

<http://www.un.org> මගින් එක්සත් ජාතීන්ගේ වෙබ් පිටුවට පිවිසිය හැකිය.

## 9. විශේෂයෙන් තරුණයන් වෙනුවෙන් සැලසුම් කළ අන් කිසිවක් එක්සත් ජාතීන්ගේ වෙබ් සයිට් ඔස්සේ ලබා ගත හැකිද?

ඔව්. The United Nations Cyber School Bus නමින් හැඳින්වෙන කඩිනම් අධ්‍යාපනික සේවාවක් ආරම්භ කර ඇත. එය පන්ති කාමරය සඳහා නව අදහස්, ලෝකය පිළිබඳ තොරතුරු හා නව උපකරණ ආදියෙන් සමන්විත ය. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 185 පිළිබඳව ක්ෂෙත්‍ර 30 කට වැඩි ගණනක් යටතේ අදාල දත්ත හා තොරතුරු පිළියෙල කර තිබේ. අනාගතයට යොමු වූ ජගත් අවලෝකනයක් ඇතුලත් ලෝකයේ විවිධ ප්‍රදේශවලින් සපයාගත් පින්තූර මේ සේවාව ඔස්සේ දැක ගැනීමට පිළිවන. Cyber School Bus වෙත පිවිසිය හැකි ලිපිනය http://www.un.org/Pubs/Cyber School Bus. ආදර්ශ එක්සත් ජාතීන්ගේ වැඩ සටහනට සහභාගි වන අයට සාකච්ඡා වේදිකාවක්ද එමගින් සැපයේ. Model UN Discussion Area (MUNDA) යනුවෙන් නම් කර ඇති මේ වේදිකාව මගින් තරුණයන්ට අන්තර් ජාලය ඔස්සේ අදහස් හුවමාරු කර ගැනීමටත් තොරතුරු බෙදා ගැනීමටත් පිළිවන. MUNDA වෙත පිවිසිය හැකි ලිපිනය <http://www.un.org/Pubs/Cyber School Bus/munda>

DPI/1888